# සමාජ සහජීවනය සහ සංහිඳියාව සඳහා වූ සංවාදය සහ ක්‍රියාකාරීත්වය වෙනුවෙන් වටපිටාව සැකසීම 2022



USAID
FROM THE AMERICAN PEOPLE

Global Communities
Sri Lanka

# සමාජ සහජීවනය සහ සංහිඳියාව සඳහා වූ සංවාදය සහ ක්‍රියාකාරිත්වය වෙනුවෙන් වටපිටාව සැකසීම

## සිද්ධි අධ්‍යනය

**ජාතික සාම මණ්ඩලය**

**2022**

**සමාජ ඒකාග්‍රතාවය සහ සංහිඳියාව (SCORE) ක්‍රියාකාරකම වෙනුවෙන්**

මූල්‍ය සම්පාදනය | ක්‍රමෝපායික දායකත්වය | ප්‍රධාන ක්‍රියාකාරිත්වය

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් සපයනු ලබන සහාය යටතේ මෙම ප්‍රකාශනය නිම කරන ලදි. මෙම ප්‍රකාශනයේ ප්‍රකාශිත මතයන් මෙම සිද්ධි අධ්‍යනට සහභාගී වූ දායකයින්ගේ මතයන් වන අතර මෙම ප්‍රකාශනය මගින් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ හෝ එක්සත් ජනපද රජයේ අදහස් අවශ්‍යයෙන්ම පිළිබිඹු නොකරයි.

**සමාජ සහජීවනය සහ සංහිඳියාව සඳහා වූ සංවාදය**
**සහ ක්‍රියාකාරිත්වය වෙනුවෙන් වටපිටාව සැකසීම**

ISBN : 978-624-5900-09-1
පළමු සංස්කරණය 2022

සියලු හිමිකම් ඇවිරිණි
සමාජ ඒකාබද්ධතාවය සහ සංහිඳියාව (SCORE) ක්‍රියාකාරකම

ප්‍රකාශනය, ජාතික සාම මණ්ඩලය : 12/14, පුරාණ විහාර පාර, කොළඹ 06, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2818344, 2854127, 2809348
ෆැක්ස් : +94 11 2819064
විද්‍යුත් තැපැල : npc@sltnet.lk
වෙබ් : www.peace-srilanka.org

ගෝලීය ප්‍රජාවන් (Global Communities) සමඟ සහයෝගයෙන් (USAID SCORE)
ව්‍යාපෘතිය,18, කින්රොස් මාවත, කොළඹ 04, ශ්‍රී ලංකාව
වෙබ් : www.globalcommunities.org

**පටුන**


| | |
|---|---|
| පෙරවදන | |
| හැඳින්වීම | |
| පළමු කතාව - | එකිනෙකා තේරුම් ගැනීමට හුරුවීම.... සමාජ ඒකාබද්ධතාවය වැදගත් වන්නේ ඇයි? |
| දෙවන කතාව - | "අපට ඇති අවස්ථාවන් පිළිබඳව අපි දුටුවා.... ස්වයං පරිවර්තනය වීම තුලින් සමාජය ශක්තිමත් කරන්නෙමු" - යශෝධා කාන්තා සමිතිය |
| තෙවන කතාව - | ධනාත්මකව ගැටුම් පරිවර්තනයේ යෙදෙන තරුණ ප්‍රජාව |
| සිව්වන කතාව - | සීමා තරණය කිරීම, ගැටුම් වෙනුවට සහයෝගීතාවය තෝරාගත් සේරුවිල සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් |
| පස්වන කතාව - | ගැටුම නොව, සංවාදය |
| සයවෙනි කතාව - | ප්‍රතික්ෂේප වූ ප්‍රචණ්ඩත්වය |
| සත්වෙනි කතාව - | එදිනෙදා ප්‍රජාතන්ත්‍රවාදය අවබෝධ කර ගැනීම |
| අටවෙනි කතාව - | රාජකාරියේදී සේවයේ සමානාත්මතාවය රඳවාගැනීම |

# පෙරවදන

USAID හි අනුග්‍රහය යටතේ ජාතික සාම මණ්ඩලය විසින් තෙවසරක සිට දිස්ත්‍රික්ක දහයක සිදු කරන ලද SCORE ව්‍යාපෘතියෙහි (ආධාර ප්‍රධාන අංකය - 720-383-18-CA-400003) වැදගත් වූ සන්ධිස්ථානයන් මෙම ප්‍රකාශනයේ සිද්ධි අධ්‍යයනයන් තුළ අන්තර්ගත වේ. මෙම ව්‍යාපෘතිය ප්‍රජා ඒකාබද්ධතාවයට සහාය දැක්වීමේ මැදිහත්වීම්වල සිට රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණුවීම් පැවැත්වීමේ ක්‍රියාකාරකම් සහ ප්‍රජා නායකයින්ගේ ධාරිතාවයන් ගොඩනැගීමේ ක්‍රියාකාරකම් දක්වා විහිදේ. තවද මෙම ව්‍යාපෘතිය හරහා ජාතික සාම මණ්ඩලය විසින් සහජීවනය සහ සංහිඳියාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රජා කණ්ඩායම් බල ගැන්වීම සිදු කළ අතර ඔවුන් සමඟ ජාතික ඒකාබද්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරන ලදි. මෙම ක්‍රියාකාරකම් කාන්තාවන්ට ජීවනෝපාය කුසලතා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් වල සිට පුස්තකාල පහසුකම් නොමැති ප්‍රජාවන් සඳහා එම පහසුකම් සපයා දීම සඳහා සිදු කරන ලද පොත් පරිත්‍යාග කිරීමේ ක්‍රියාකාරකම් දක්වා විහිදිණි.

මෙහි අන්තර්ගත වන සිද්ධි අධ්‍යයනයන් අම්පාර, යාපනය, මොණරාගල, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක වල සිදු වූ සිදුවීම් පාදක කරගෙන අන්තර්ගත කර ඇති අතර එම සිද්ධි හරහා බහුවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් ව්‍යාපෘතිය හරහා ළගා කරගත් ප්‍රතිඵල පිළිබඳ අවධානය යොමු කර ඇත. එහිදී සිංහල, දෙමළ සහ මුස්ලිම් ජන සමාජ තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් සහ සිවිල් සමාජය සහ රාජ්‍ය අංශ මූලික කරගෙන සිදු කරන ලද ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් රාජ්‍ය නිලධාරීන් සහ තේරී පත් වූ පළාත් පාලන නියෝජිතයන් සඳහා මෙහෙයවනු ලැබූ වෙනස් කොට සැලකීමකින් තොරව පාරිභෝගික සේවා සැපයීම පිළිබඳ පුහුණු මාලාව පසුගිය වසර තුළ සිදු වූ ඉතා වැදගත් ක්‍රියාකාරකමක් ලෙස හැඳින්විය හැකිය. මෙම පුහුණුව එක්සත් ජනපදයේ සාමය සඳහා වූ ආයතනය විසින් සිදු කරන ලද අවශ්‍යතා ඇගයීමකට අනුව නිර්මාණය කරන ලද අතර එය පසුගිය වසර තුළ රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප පාරිභෝගික හිතවාදී ආකල්ප සහ හැසිරීම් බවට පරිවර්තනය කිරීමට මහත් සේවයක් සිදු කරන ලදි.

ව්‍යාපෘතියේ සංකල්පකරණ අදියරේ සිට SCORE හවුල්කරුවෙකු ලෙස, ජාතික සාම මණ්ඩලය එහි පළපුරුද්ද, දැනුම සහ ප්‍රවීණත්වය අන්තර් වාර්ගික සබඳතා දියුණු කිරීමටත් පශ්චාත් යුද්ධ කාලය තුළ ජන වාර්ගික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමටත් භාවිතා කර ඇති අතර මෙම ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා අරමුදල් පරිත්‍යාග කරන ලද USAID ප්‍රමුඛ ඇමරිකානු ජනතාවට ජාතික සාම මණ්ඩලය ලෙස අපගේ කෘතඥතාවය මෙලෙස පළ කර සිටිමු.

ජෙහාන් පෙරේරා
විධායක අධ්‍යක්ෂක
ජාතික සාම මණ්ඩලය
2022 පෙබරවාරි

# සමාජ සහජීවනය සහ සංහිඳියාව සඳහා වූ සංවාදය සහ ක්‍රියාකාරිත්වය වෙනුවෙන් වටපිටාව සැකසීම

සමාජ සහජීවනය යන්නෙන් අදහස් වන්නේ සමාජ ගැටුම් සඳහා පාදකවන හේතුන් නොමැති වීම පමණක් නොව ක්‍රියාකාරී සමාජ සම්බන්ධතා පවත්වාගැනීමයි. එය ඇත්ත වශයෙන්ම, පශ්චාත් යුධ ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව සාක්ශාත් කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වන අතර මෙහිදී හවුල් වටිනාකම් ගොඩනැගීම සහ පොදු වැඩකටයුතුවල නියැලීම වැදගත් වේ. සමාජ සංහිඳියාව ගොඩනැගීම සහ සංහිඳියා ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම ජාතික සාම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ වැදගත් අරමුණු දෙකක් වී ඇති අතර ඉදිරියේදී ද එය එසේම වනු ඇත.

2018 දී, ජාතික සාම මණ්ඩලය විසින් එක්සත් ජනපද සංවර්ධන සහාය (USAID) සහ ගෝලීය ප්‍රජාවන් (Global Communities) සමඟ එක්ව සියල්ලන් නියෝජනයවන මෙන්ම සාමුහික වූ ශ්‍රී ලාංකීය අනන්‍යතාවයක් ප්‍රවර්ධනය කිරීමටත්, රටේ විවිධ ජනවාර්ගික සහ ආගමික ප්‍රජාවන් අතර සහජීවනය ඇති කිරීමටත්, එකිනෙකා සමඟ අවබෝධයෙන් ජීවත්වීමේ හැකියාව ශක්තිමත් කිරීමටත්  මෙම  සමාජ ඒකාබද්ධතා සහ සංහිඳියාව (SCORE) ක්‍රියාකාරකම  ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ජාතික සාම මණ්ඩලය මඟින් පසුගිය වසර තුනක කාලය තුළ සිදු කෙරුණු ක්‍රියාකාරකම් තුලින් වෙන් වූ ප්‍රජාවන් සම්බන්ධ කරගනිමින් සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා  කටයුතු කළ අතර මෙහිදී පුරවැසියන් විසින් නව අදහස් ක්‍රියාවට නංවන ලද අතර ප්‍රතිසන්ධාන ක්‍රියාවලීන්හි නිර්මාණාත්මක ප්‍රජා සහභාගීත්වයට පහසුකම් සැලසීම ව්‍යාපෘතිය හරහා සිදු කරන ලදී. තවද සමාජ සහජීවනය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය හා ජාතික රාජ්‍ය ආයතන සහ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමත් මේ හරහා සිදු කරන ලදී.

වව්නියාව, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, යාපනය, මොණරාගල, මහනුවර, මඩකලපුව, අම්පාර, අනුරාධපුර සහ මුලතිව් දිස්ත්‍රික්කවල ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන සහ පළාත් පාලන ආයතන ඇතුළු විවිධ ප්‍රජාවන් සමඟ කථිකාවක් නිර්මාණ කිරීමට ප්‍රජාවන් පුහුණු කිරීම, උපදේශනය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා ජාතික සාම මණ්ඩලය කටයුතු කරන ලදී. ඒවා තුලින් පවතින ගැටුම් වලට හේතු වූ හෝ ගැටුම් ඇති කිරීමට හැකියාව ඇති ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම සිදුකෙරිණි. මේ අනුව, SCORE හි අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික සාම මණ්ඩලය, රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයන්හි නිර්මාණශීලි අදහස් ඔස්සේ ක්‍රියා කරන ලදී. මෙම ව්‍යාපෘතිය ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ප්‍රජාවන් සමඟ ක්‍රියා කළ අතර මිනිසුන්ගේ ගැටුම් අවම කිරීම සහ නායකත්ව කුසලතා ගොඩ නැංවීමට මෙම ව්‍යාපෘතිය පිටිවහලක් වූ අතරම සහභාගීත්වය තුලින් ප්‍රජා තීරණ ගැනීමේ වේදිකා සෑදීම සඳහා අවශ්‍ය හැකියාවන් වැඩිදියුණු කරන ලදී. තවද මෙහිදී ගැටුම්වලින් පීඩාවට පත් වූ ජනතාවට තිරසාර සාමයක් සඳහා තම දායකත්වය ලබා දීමට ප්‍රජා පාදක ක්‍රියාකාරකම් සහාය විය.

ව්‍යාපෘතියේ පළමු අදියර යාපනය, ත්‍රිකුණාමලය, වවුනියාව සහ මොණරාගල දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක විය. යාපනය දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය ග්‍රාම නිලධාරී වසම් පහක ක්‍රියාත්මක විය. යාපනයේ තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉල්ලවාලෙයි වයඹ, පලාලි උතුර, කොල්ලන්කලඩ්ඩි, පලෙයි වීමන් කාමම්, වාසවිලාන් නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශද, මොණරාගල, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහගොඩයාය, මහසෙන්පුර, උඩගම ග්‍රාම නිලධාරී වසම් සහ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මදුරකැටිය, කුඹුක්කන ග්‍රාම නිලධාරී වසම්වලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ත්‍රිකුණාමලයේ, SCORE විසින් සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමගිපුර, ආරියමන්කේනි, ලිංගපුරම්, සුමේදන්කරපුර, නාවක්කේනිකාඩු ග්‍රාම නිලධාරී වසම් වල සිය කටයුතු සිදු කරන ලදී. වවුනියාවේදී, SCORE විසින් වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිකුඩිඉරිප්පු ග්‍රාම නිලධාරී වසමද,වවුනියා දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අග්බෝපුර, මරුදමඩු සහ සෙද්දිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නෙරියකුලම්, උඩලියාර්කුලම් යන ප්‍රදේශවලද කටයුතු සිදු කරන ලදී.

## ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ආකාරය

### ප්‍රජා සම්බන්ධකාරකයින්

ප්‍රජාවන් සහ SCORE අතර සම්බන්ධතාවය නිර්මාණය කිරීම සඳහා ජාතික සාම මණ්ඩලය විසින් රාජ්‍ය අංශයෙන්, සිවිල් සමාජයෙන් හෝ බිම් මට්ටමේ ප්‍රජාවන්ගෙන් අදාළ ග්‍රාම නිලධාරීන් වෙතින් ප්‍රජා සම්බන්ධකාරකයින් තෝරා ගන්නා ලදී. සමාජ ඒකාබද්ධ ක්‍රියාකාරකම්වල බිම් මට්ටමේ ප්‍රජාවන් බලමුලු ගැන්වීම තුලින් මෙම ප්‍රජා සම්බන්ධකාරකයින් SCORE ව්‍යාපෘතිය සඳහා සහාය විය. ක්ෂේත්‍ර කටයුතු සඳහා අලුතින් තෝරාගත් ප්‍රජා සම්බන්ධකාරකයින් වෙත මාර්ගෝපදේශනය ලබාදීම සඳහා, 2019 ජනවාරි මාසයේදී 34 දෙනෙකුගෙන් යුත් පුහුණුකරුවන්ගේ පුහුණු වැඩමුළුවක් පැවැත්විණි. විශේෂඥ උපදේශක කණ්ඩායමක් වන විකල්ප පුහුණු හවුල්කරුවෝ (PALTRA) ආයතනයේ පහසුකම් සැපයීම සහිතව වැඩමුළුව සඳහා නව පුහුණු මොඩියුලයක් සකස් කරන ලද්දේ ධාරිතා වර්ධනය සඳහා අන්තර්ක්‍රියාකාරී සහභාගීත්ව ප්‍රවේශයන් ආශ්‍රිතවය.

### ප්‍රජා තක්සේරුකරණය

SCORE විසින් 2019 දී ව්‍යාපෘතියෙන් ආවරණය කෙරෙන සියලුම දිස්ත්‍රික්කවල ප්‍රජා ඇගයීම් සිදු කරන ලදී. තක්සේරු කිරීම් හරහා, ජාතික සාම මණ්ඩලයේ කණ්ඩායම ගම්වල ඓතිහාසික තොරතුරුවලට අදාළ වටිනා දත්ත රැස් කරන ලද්දේ භූගෝලීය සැකසුම සහ ජනවිකාශ පැතිකඩ, ආගමික, සමාජීය සහ සංස්කෘතික පසුබිම, ජීවනෝපායන් සහ ආදායම් මාර්ග, පාරිසරික තත්ත්වයන්, දේශගුණික විපර්යාස සහ එහි බලපෑම්, සමාජ පුද්ගලික, ආයතනික සමාජ ජාල විශ්ලේෂණය, අන්තර් වාර්ගික කණ්ඩායම් අතර අන්තර්ක්‍රියා, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා සහභාගීත්වය, සමාජ ව්‍යුහය තුළ ආන්තික කණ්ඩායම්වලට සැලකීම, තරුණ හා ළමා සහභාගීත්වය, සහ අධ්‍යාපන මට්ටම් සහ රැකියා අවස්ථා තිබේද වැනි කරුණු අධ්‍යනයකට ලක් කිරීමෙනි. මෙම සොයාගැනීම් ප්‍රතිඵල වාර්තාවල සඳහන් වී ඇත.

යාපනය දිස්ත්‍රික්කයේ තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලවාලෙයි වයඹ, පලාලි උතුර, කොල්ලන්කලඩ්ඩි, පලෙයි වීමන් කාමම් සහ වාසවිලාන් නැගෙනහිර යන ක්‍රියාකාරී ග්‍රාම නිලධාරී වසම් පහක් යටතේ තක්සේරු කිරීම් සිදු කරන ලදී. තවද මොණරාගල, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහගොඩයාය, මහසෙන්පුර, සහ උඩගම යන ග්‍රාම නිලධාරී වසම්වල තක්සේරු කිරීම් සිදු කරන ලදී. මීට අමතරව ත්‍රිකුණාමලය, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමගිපුර, ආරියමන්කේනි, නාවක්කේනිකාඩු ග්‍රාම නිලධාරී වසම්වල ප්‍රජා ඇගයීම් තුනක් සිදු කරන ලදී. වවුනියාවේදී, වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුදිකුඩිඉරිප්පු ප්‍රදේශයේදී තක්සේරුවක් සිදු කෙරුණි.

## පුහුණු, උපදේශකත්වය සහ පහසුකරණය

ධනාත්මක වෙනස්කම් ඇතිකිරීමට සහාග ගොඩ නැගීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාවන් සහ ප්‍රාදේශීය සහ මධ්‍යම රජයේ පාර්ශවකරුවන් එකට එකතු කොට සාමූහිකව ග්‍රාමීය මට්ටමින් පළාත් පාලන ආයතන, සිවිල් සමාජ සංවිධාන (CSOs) සහ ප්‍රජා සාමාජිකයින් පුහුණු කිරීම සහ උපදේශන කිරීම සඳහා ජනතාවගෙන් ජනතාවට (P2P) ක්‍රමවේද SCORE තුලින් භාවිතයේ යෙදවිය.

ග්‍රාම නිලධාරී මට්ටමේ පුහුණු කිරීම් සහ ඒකරාශී කල ප්‍රජා ඒකාබද්ධතා ක්‍රියාකාරකම් වැනි වැඩසටහන් පැවැත්වීම මගින් ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුලදී ප්‍රජාවගේ සහභාගීත්වය ඵලදායීව ඉහළ නැංවීමට ව්‍යාපෘතිය උත්සාහ දැරීය. තවද, මෙම ව්‍යාපෘතිය මගින් සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ පළාත් පාලන සහ ජාතික තලයේ පාර්ශවකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කිරීම් සිදු කරන ලදී.

යාපනයේ ක්‍රියාකාරකම්වලට අවිහිංසාවාදී සන්නිවේදනය සම්බන්ධ පුහුණු ඇතුළත් විය. ගුරුවරුන්, දෙමාපියන් සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සාමය ගොඩනැගීම සහ ඵලදායී සන්නිවේදනය පිළිබඳ පාසල් මට්ටමේ දැනුවත් කිරීම, යෞවන සමාජ සාමාජිකයින්ගේ සහ සහජීවන සංගම්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් වැටක් තැනීම, ප්‍රජා මට්ටමේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සමඟ ක්‍රියා කරන යාපනයේ ප්‍රජා වේදිකාවල සාමාජිකයින් විසින් මොණරාගලින් තෝරා ගත් ප්‍රජා සාමාජිකයින් සමඟ සිදු කරන ලද හුවමාරු සංචාරයක් ද මෙයට ඇතුළත් විය.

මොණරාගලදී, ජාතික සාම මණ්ඩලයේ SCORE කණ්ඩායම ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම සඳහා ප්‍රදේශයේ හඳුනාගත් අවශ්‍යතා සපුරාලීම සඳහා පොකුරු ක්‍රියාකාරකම් දෙකක් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ක්‍රියාකාරකම් පහළවක් පවත්වන ලදී. සාමය සම්බන්ධ සංකල්ප පිළිබඳව විවිධ ප්‍රජාවන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්විණි. කියවීම තුළින් සංහිඳියාව ශක්තිමත් කිරීම සඳහා පොත් පරිත්‍යාග වැඩසටහනක් සමඟින් ලෝක පොත් දිනය සමරනු ලැබීය. තෝරාගත් ප්‍රදේශවල ගැටුම් සඳහා තුඩුදෙන සාධක ඇති ප්‍රදේශ ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජා සංවාද දාමයක් වන “මතකය භාවිතය” වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම සංවාද හරහා විවිධ ප්‍රජාවන් අතර සාමකාමී සබඳතා පවත්වාගෙන යාමට ප්‍රජා මට්ටමින් සැලකිය යුතු බලපෑමක් SCORE හරහා ඇති විය. මෙම මොඩියුලයෙන් පසුව “එදිනෙදා ප්‍රජාතන්ත්‍රවාදය හරහා ඔරොත්තු දෙන ප්‍රජාවන්” නම් පුහුණු මොඩියුලයක් නිර්මාණය කර ගැනීම සැලකිය යුතු කරුණකි. ප්‍රජාවෙහි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා උගත් පාඩම් සහ ඔවුන්ගේ අතීත අත්දැකීම් පාදක වූත් වටිනාකම් පදනම් වූත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා ප්‍රජාවෙහි කාර්යභාරය පිළිබඳව සහභාගි වන්නන් අතර සංවාදය උත්තේජනය කිරීම සඳහාත් මෙම මොඩියුලය නිර්මාණය කරන ලදී. තවද, උතුරුකරයේ ප්‍රජාවන් සමඟ ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා ප්‍රජා නියෝජිතයින් සමඟ ප්‍රජා හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මදුරකැටිය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දී අවිහිංසාවාදී සන්නිවේදනය පිළිබඳ වැඩමුළුවක් ද පවත්වන ලදී.

ත්‍රිකුණාමලයේදී SCORE විසින් පොකුරු ක්‍රියාකාරකම් දෙකක් සහ සමගිපුර සහ ආරියමන්කේනි ප්‍රදේශවල කාන්තාවන් 50 දෙනෙකු සඳහා සංස්කෘතික හුවමාරු වැඩසටහන් සිදු කරන ලද අතර ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ක්‍රියාකාරකම් 14ක් සිදු කරන ලදී. ප්‍රචණ්ඩ නොවන සන්නිවේදන (NVC) පුහුණු, පාසල් ළමුන් සඳහා 'සංහිඳියාව' පිළිබඳ වැඩසටහනක්, ප්‍රජා සංවර්ධනය සඳහා ව සහභාගීත්ව ක්‍රියාකාරකම් (PACE), සමඟිපුර සහජීවන සමිති සාමාජිකයින් සඳහා පුහුණුව, නාවක්කේනිකාඩු ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සහ සුමේධංකරපුර ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ප්‍රජා සාමාජිකයින් සඳහා 'මතකය භාවිතය' පිළිබඳ වැඩසටහන් මේ හරහා සිදුවිය.

වව්නියාවේදී, සමාජ සංහිඳියාව පිළිබඳ වීථි නාට්‍යයක් ඇතුළුව එක් පොකුරු ක්‍රියාකාරකමක් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ ක්‍රියාකාරකම් තුනක් සිදු කරන ලදී.

තවද සංහිඳියාව සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා මධ්‍යම රජයේ සහ පළාත් පාලන ආයතනවල හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා තෝරාගත් රාජ්‍ය නිලධාරීන් සහ පළාත් පාලන නියෝජිතයන් සඳහා 'නීතියේ ආධිපත්‍යය' සහ 'සමාජ සහජීවනය සහ සංහිඳියාව' පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීමට SCORE පළමු අදියර යටතේ ක්‍රියාකාරී දිස්ත්‍රික්ක සියල්ලෙහි කටයුතු කෙරුණි. ඒ අනුව, ඔවුන් තම ප්‍රදේශයන්හි ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට සහ එවැනි අරමුණු වෙනුවෙන් ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රජා වේදිකාවලට ආධාර කිරීම සඳහා මෙම මූලික පියවරේදී දළ වශයෙන් රාජ්‍ය නිලධාරීන් 135 ක් සහ පළාත් පාලන ආයතන නියෝජිතයින් 90 දෙනෙකු පුහුණු කරන ලදී.

2020 ඔක්තෝම්බර් මාසයේදී දෙවන අදියර ආරම්භ කරමින් රට තුළ සංහිඳියාව ශක්තිමත් කිරීම සඳහා මෙම ප්‍රජා වේදිකා සවිබල ගැන්වීම සඳහා SCORE සහජීවන සමිති සමඟ වැඩ කිරීමට ආරම්භ කරන ලදී. ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙක තුනක් එක්කොට පුහුණු කණ්ඩායම් 16ක් ආරම්භ කෙරිණි. මහනුවර, මඩකලපුව, මොණරාගල, ත්‍රිකුණාමලය, අම්පාර, අනුරාධපුරය, වව්නියාව, කිලිනොච්චිය, යාපනය සහ මුලතිව් යන දිස්ත්‍රික්ක දහයෙහි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. මෙම අදියරේදී බිම් මට්ටමේ ප්‍රජාවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් පිළිබඳ දැනුම පෝෂණය කිරීම සඳහා, සියලු සහජීවන සමාජයන් සඳහා 'එදිනෙදා ප්‍රජාතන්ත්‍රවාදය හරහා ඔරොත්තු දෙන ප්‍රජාවන්' පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වන ලදී.

තවද, ව්‍යාපෘති කණ්ඩායම විසින් රාජ්‍ය නිලධාරීන් සහ පළාත් පාලන ආයතන නියෝජිතයන් සඳහා වෙනස් කොට සැලකීමකින් තොර පාරිභෝගික සේවා සැපයීම පිළිබඳ පුහුණු කිරීම් සිදු කරන ලදී. මෙම පුහුණුව පියවර දෙකකින් සිදු කරන ලදී.

අ) තෝරාගත් රාජ්‍ය සේවකයින් සහ පළාත් පාලන ආයතනයන්හි නියෝජිතයින්ට වෙනස් කොට සැලකීමකින් තොර පාරිභෝගික සේවා සැපයීම (NDCS) පිළිබඳ අවශ්‍ය දැනුම සහ ආකල්ප ලබා දීම සිදුකෙරුණු අතර මෙහිදී ස්ත්‍රී පුරුෂ භාවය සහ ආබාධිත සහිත වුවන්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැළකීම් සම්බන්ධව ද අවබෝධය ලබා දෙන ලදී.

ආ) දෙවන පියවර වනුයේ ආයතන ප්‍රධානීන්ගේ සහාය ඇතිව අදාළ ආයතනවල වෙනස් කොට සැලකීමේ පාරිභෝගික සේවා හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෙදීමයි.

SCORE ව්‍යාපෘති ක්‍රියාකාරකම් හරහා උගත් පාඩම් තුලින් ජාතික සාම මණ්ඩලයේ වත්මන් සහ අනාගත ක්‍රියාමාර්ග පෝෂණය වේ. සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වැඩ කටයුතු අඛණ්ඩව ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සඳහා ජාතික සාම මණ්ඩලය රාජ්‍ය සහ රාජ්‍ය නොවන දේශීය හවුල්කරුවන් සමඟ සම්බන්ධතා පවත්වයි.


මෙම පොත් පිංච 2018 සිට 2021 දක්වා ජාතික සාම මණ්ඩලයේ SCORE ක්‍රියාකාරකම්වල තෝරාගත් කොටස්වල එකතුවකි. ඒකාත්මික වූ අරමුණක් වෙනුවෙන් අප සමඟ සහයෝගීව කටයුතු කළ පහත සඳහන් සංවිධාන සහ පුද්ගලයින්ගේ දායකත්වය ස්තුති පූර්වකව සිහි ගැන්වීමට කැමැත්තෙමු.

සර්වෝදය - මහනුවර
ප්‍රවේශ්‍යතා, අධීක්ෂණය සහ ආබාධිතභාවය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය (CAMID) - මඩකලපුව
කාන්තා සංවර්ධන සම්මේලනය - මොණරාගල
සංවර්ධනය සඳහා සමාජ සංවිධාන ජාලකරණය - අම්පාර, යාපනය
ජනතා සංවර්ධන සංසදය - ත්‍රිකුණාමලය
මනුෂ්‍යත්වය සහ ඒකාබද්ධ සංවර්ධන මධ්‍යස්ථානය (CHID) - මුලතිව්
ශ්‍රී ලංකා රතු කුරුස කමිටුව (SLRC) - වවුනියාව

# එකිනෙකා තේරුම් ගැනීමට හුරුවීම

## සමාජ ඒකාබද්ධතාවය වැදගත් වන්නේ ඇයි ?

“පුස්තකාලය සියලු දෙනාටම සමානව ඉන්න පුළුවන් අපූරු තැනක්. කිසිවෙකු ඇතුළුවීම කිසිවෙකු වළක්වන්නේ නැහැ - සියලු දෙනා එක වාගේම පිළිගන්නා තැනක්,” යන අදහස දැක්වුයේ පහ වසරේ සිට පුස්තකාල පරිශීලකයෙකු වූ මහසෙන්පුරයේ 19 හැවිරිදි සිසුවෙක් වන උදාර වික්‍රමසිංහයි. “පොත් කාණ්ඩවලට බෙදා ඇති මුත් පැමිණෙන පුද්ගලයින් විවිධ ජන වර්ගයන්ට, ආගම් හෝ කුලවලට හෝ කොටස් වලට වෙන් කෙරෙන්නේ නැහැ, අපි නිශ්ශබ්දව සිටිය යුතු නිසා, අපි එකිනෙකා සමඟ කතා කරන්නේ නැහැ, නමුත් අපි හැමෝම එකට කියවමින් ඉගෙනගන්නවා.”



විවිධ පුද්ගලයන් එකම වහලක් යටට ගෙන එන නිසා උදාර පුස්තකාලය අගය කරයි



ෆාතිමා පුස්තකාලය දකින්නේ ඇයව නිදහස් කරන ස්ථානයක් ලෙසයි

ශ්‍රී ලංකාවේ නොසැලකිල්ලට ලක්වූ දිස්ත්‍රික්කයක් වන මොණරාගල පිහිටි බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහසෙන්පුර ග්‍රාමයට පුස්තකාලයක් නැත. නමුත් උදාර විශේෂයෙන් සතුටට පත්ව සිටින්නේ 2020 මාර්තු මාසයේදී පැල්වත්තේ තම පාසලට යාබදව පිහිටි පුස්තකාලයට ප්‍රදානය කරනු ලැබූ ප්‍රබන්ධ, චරිතාපදාන, සංස්කෘතිය සහ සමාජය ආදී පුළුල් විෂයපථයන්ගෙන් යුත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය පොත් මඟින් ප්‍රතිලාභ ලැබීම නිසාය. මෙය ජාතික සාම මණ්ඩලය විසින් මොණරාගලදී ක්‍රියාත්මක කරන ලද සමාජ ඒකාබද්ධතාවය සහ සංහිඳියාව (SCORE) වැඩසටහනේ මුලපිරීමකි. තවදුරටත් ඔහු පැහැදිලි කරන්නට යෙදුනේ ”මිනිසුන්ට පොත් ලබා දීම එතරම් විශේෂ වූ දෙයක්, දුරස්ථ ප්‍රදේශවල පුස්තකාල හිඟයි, මිනිසුන් පවතින ඒවා වෙත ආකර්ෂණය වීම නිතැතින් සිදුවන දෙයක්” යනුවෙනි.

“අපගේ පුස්තකාලයේ පොත් සංඛ්‍යාව ක්ෂණිකව 200කින් පමණ වැඩි වුණා. කාලෙකට පස්සේ අලුත් පොත් ලැබුණා. මෙම පරිත්‍යාගය විශේෂයෙන් අප ශිෂ්‍ය ප්‍රජාව විසින් කොතරම් අගය කළාදැයි ඔබට සිතාගත හැකියි” යනුවෙන් පැල්වත්ත මහජන පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපති ඩිලානි දිසානායක පැවසීය. “අපට නුදුරින් ඇති පැල්වත්ත මහා විද්‍යාලයේ බොහෝ සිසුන් තම බස් රථය පැමිණෙන තුරු පාසල අවසන් වී පැයක් බලා සිටිය යුතුය, එනිසා පාසලේ අවසන් සීනුව නාද වූ සැනින් පුතකාලය පිරීයාම දකින්න පුළුවන්.”





පුස්තකාලයට පොත් පිරිනැමීමත් සමග දරුවන් වැඩිපුර කියවීමට පෙළඹවීම සඳහා උත්සවයක් පැවැත්වීය

සියලු ජනවාර්ගික සහ ආගම්වල නායකයින්, ගැහැණු සහ පිරිමි දරුවන්, වැඩිහිටියන්, ප්‍රජා පහසුකම් සපයන්නන් නොහොත් 'ප්‍රජා සම්බන්ධකාරකයින්' සහ පළාත් පාලන නිලධාරීන්ගෙන් සැදුම්ලත් ප්‍රජා සාමාජිකයින් ඇතුළත් වූ ඒකාබද්ධ අභ්‍යාසයක් තුලින් හඳුනාගත් ප්‍රමුඛතා පදනම් කරගෙන SCORE විසින් සිදු කරන ලද ප්‍රජා තක්සේරුවේදී හඳුනා ගත් ගැටළු ආමන්ත්‍රණය කිරීමේ වෑයමක් ලෙස මෙම ක්‍රියාකාරකම සිදු කරන ලදි.

"මහසෙන්පුර ග්‍රාමයට මහජන පුස්තකාලයක් නැති බවත් ඔවුනට ඇති ආසන්නම පුස්තකාලය පැල්වත්ත මහජන පුස්තකාලය බවත් අප විසින් අධ්‍යයනය කරනු ලැබුවා. පැල්වත්තේ සහ මහසෙන්පුර සිටින සිංහල, මුස්ලිම් සහ දෙමළ දරුවන් පුස්තකාලය භාවිතා කරන බවත් පෙනී ගියා", එස්.වී.පී. සේපාලිකා, ජාතික සාම මණ්ඩලයේ වැඩසටහන් නිලධාරිනී. "පුස්තකාලයට සම්පත් ලබාදීම තුලින් මහසෙන්පුර සහ පැල්වත්ත ජනතාවට, විශේෂයෙන්ම දරුවන්ට ප්‍රතිලාභ ලැබෙන බව ප්‍රත්‍යක්ෂ වූවා." දරුවන් සමඟ සිදුකරනු ලැබූ ඉලක්කගත කණ්ඩායම් හමු තුලින්ද පෙන්වා දී තිබුණේ, අන්තර්ජාලය හරහා තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා සැලකිය යුතු සංඛ්‍යාවකට ස්මාට් ජංගම දුරකථන සහ අන්තර්ජාල සම්බන්ධතා ලබා ගත නොහැකි මට්ටමේ ආර්ථික තත්ත්වයක් ඇති බවයි.

එපමණක් නොව, ඔවුන්ගේ ප්‍රදේශයේ, රටෙහි මෙන්ම ගෝලීය වශයෙන් මිනිසුන්ගේ විවිධ සංස්කෘතීන් පිළිබඳව කියවීමටත් ඒ ගැන තව අධ්‍යයනය කිරීමටත් ළමුන් පෙළඹවීම සඳහා මෙම වැඩසටහන මඟින් අන්තර්ක්‍රියාකාරී සැසි පවත්වනු ලැබීය. සහභාගි වන්නන් සහජීවනය සහ සංහිඳියාව යන තේමාවන් ද ගවේෂණය කළහ. "මේ අලුත් ක්‍රියාකාරකම් වෙනස්, ඒවා අපට අලුත් අත්දැකීමක්" උදාර පැවසීය. "අප විසින්ම නිර්මාණය කරගත් සීමිත ඉඩකඩෙන් සහ රාමුවෙන් මිදිය යුතු බව අපට වැටහෙන්නට වුනා වගේම අපට තේරුම් ගැනීමට, දැකීමට තවත් බොහෝ දේ තිබෙන බව වැටහී ගියා."





අන්තර් ක්‍රියාකාරී සැසි මගින් සහජීවනය සහ සංහිඳියාව පිළිබඳව මෙනෙහි කිරීමට දරුවන් පොළඹවන ලදී

පැල්වත්තේ පදිංචි 17 හැවිරිදි ෆාතිමා හස්නා ද නිතිපතා පුස්තකාල භාවිතා කරන්නියකි: “මම දකින්නේ පුස්තකාලය ළමයින්ට සහ තරුණයින්ට විශේෂ ස්ථානයක් හැටියටයි. අපි විවිධ ප්‍රජාවන්ට අයත් විය හැකි නමුත් අපට එතන ගෙදර වගේ හැඟෙනවා‘. මම පුස්තකාලයේ ඉන්නකොට මට විවේකයක් දැනෙනවා, යම් ආතතියක් තියෙනවානම් ඒකත් පහව යනවා. එතන සීමා මායිම් නැහැ. අපි පුස්තකාල නීති අනුගමනය කළ යුතුයි, ඒත් මට එතන දැනෙන්නේ ලොකු නිදහසක්.

ෆාතිමා ප්‍රාථමික පාසලේ සිටියදී, ඇගේ මව පාසල හැරුණු පසු ඇයව පුස්තකාලයෙන් රැගෙන ගියාය. නමුත් ඇය වයසින් මුහුකුරා ගියත්, තනිවම බසයෙන් ගෙදර යාමට හැකි වුවත්, ඇය ඇගේ මිතුරන් සමඟ පුස්තකාලයේ කාලය ගත කළාය. “මගේ දුව මාව සතුටු කරනවා,” 45 හැවිරිදි සිත්ති හතීජා පවසයි. “ඇයට කුඩා කල සිටම ඕනේ වුනේ පොත් මිසක් සෙල්ලම් බඩු නෙවෙයි. මම පුස්තකාලය දකින්නේ දරුවන්ට, දෙමාපියන්ට, සාමාන්‍ය ජනතාවට හොඳ තැනක් හැටියටයි. ෆාතිමා වෛද්‍යවරියක් වෙන්න සිහින දකිනවා වගේම ඒ සිහිනය සැබෑ කරගන්න බව මම දන්නවා.”

උදාර උසස්පෙළ සඳහා වාණිජ විෂයන් හැදෑරුවත් ඔහුගේ අදහස් පුදුම සහගත ලෙස වෙනස් ය: “මට අපේ මෙතෝදිස්ත පල්ලියේ දේවගැතිවරයකු වීමට ආසයි. සාමය සහ සංහිඳියාව අප තුළ තියෙනවා, ඒ ගුණධර්ම පෝෂණය කර ආරක්ෂා කරගත යුතුය. ජාතික සාම මණ්ඩලය සහ ඒ වගේ සංවිධාන පවතින්නේ මිනිසුන් සහජීවනය අගය නොකරන නිසා බව මට වැටහෙනවා. ඒක හරියට ලුණු වගේ, එය ජීවිතය ආරක්ෂා කරනවා, ඒවා නොමැතිව අපට බැහැ. මම හිතන්නේ අපි පොත්වලින් ඈත් වෙන තරමට, අපිට තේරෙන ප්‍රමාණය අඩු වෙනවා”, අපිට සාමයෙන් ජීවත් වෙන්න තියෙන හැකියාව අඩු වෙනවා.”

උදාරගේ නිවස පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු කරුණක් නම් එය මහා සමාජයේ ක්ෂුද්‍ර පැතිකඩක් ලෙස සැලකිය හැකි වීමයි. “මගේ අම්මයි මමයි ක්‍රිස්තියානි. මගේ පියා සහ මගේ සහෝදරයන් දෙදෙනා බෞද්ධයන්,” ඔහු සඳහන් කරයි. “අපි බහු ආගමික පවුලක්, අපට කවදාවත් විශේෂිත ආගමක් තෝරා ගන්න කියා කවුරුත් බල කළේ නැහැ. මගේ පියා ආයුර්වේද වෛද්‍යවරයෙක්, මගේ අම්මා පොඩි කඩයක් පවත්වාගෙන යනවා. ඔවුන් අපට කැමති ඕනෑම ආගමක් අදහන්න ඉඩ දුන්නා.” කෙසේ වෙතත්,

කිතුනුවන්, විශේෂයෙන්ම පල්ලියට සමීප අය ගැන යම් තරමක අවිශ්වාසයකින් සලකනු ලැබීම ගැන ඔහු කනස්සල්ලට පත්ව සිටින බව පෙනී ගියා, "අපගේ ආගමට අන්‍යයින් හැරවීම සහ වෙනත් ආගම්වලට අගෞරව කිරීම සම්බන්ධයෙන් අපට චෝදනා එල්ල වෙන අවස්ථා තියෙනවා. අපට අවශ්‍ය වන්නේ එය එසේ නොවන බව ජනතාවට අවබෝධ කර දීමටයි.

මෑතකදී ඇයගේ සාමාන්‍ය පෙළ විභාගය අවසන් වූ දා සිට, ෆාතිමා තම විවේක කාලයෙන් කොටසක් අනෙකුත් ළමයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා කැප කිරීමට තීරණය කළාය. "එයාලට මොනවා හරි ඉගෙන ගන්න අවශ්‍ය වුනාම එයාල මාව හොයාගෙන එනවා. මුස්ලිම් ළමයින්ට විතරක් නෙවෙයි, සිංහල, දෙමළ දරුවන්ටත් මම උදව් කරනවා, මට අවශ්‍ය නැති පොත් පත් ගොඩගසා ගන්නේ නැතිව එයාලට දෙනවා. මම ළමයින්ව කියවීමට උනන්දු කරනවා. වර්තමාන වසංගතය අතරතුර, කියවීමේ වැදගත්කම වෙනදාටත් වඩා පැහැදිලිව දැනුනා. කියවීම අපව සම්පූර්ණ කරයි යන කියමනට මම සම්පූර්ණයෙන් එකඟයි."

උදාර ඒ සාකච්ඡාව තවත් පියවරක් ඉදිරියට තැබුවේය. ඔහු පෙන්වා දෙන්නේ "කියවීමෙන් මිනිසුන්ව එකට එකතු කර ගත හැකි" බවයි. සාමය සඳහා සමාජ සහජීවනය කෙතරම් තීරණාත්මකද යන්න පිළිබඳ කථිකාව දිගටම කරගෙන යාමට ඔහු කැමතිය. "වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය දිහා බලනකොට, සාමය තවමත් තරමක් අවිනිශ්චිත සහ  තරමක් තාවකාලික බව පෙනුනත් අපිට පුළුවන් පොඩියට හරි පටන් අරගෙන වැඩි ජවයකින් සාමය සඳහා වැඩ කරගෙන යන්න."

# “අපට ඇති අවස්ථාවන් පිළිබඳව අපි දුටුවා..”

## ස්වයං පරිවර්තනය වීම තුලින් සමාජය ශක්තිමත් කරමු - යශෝධා කාන්තා සමිතිය

2019 ජුනි මස 29 වන දින බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී කාන්තා පිරිසකගේ සාම්ප්‍රදායික රැස්වීමකට වඩා වෙනස් වූ රැස්වීමක් පැවැත්විණි. සම්පූර්ණයෙන්ම සිංහල කාන්තාවන්ගෙන් සැදුම්ලත් උඩගම ගම්මානයේ යශෝධා කාන්තා සමිතිය තම කණ්ඩායමට අසල්වැසි මුස්ලිම් කාන්තාවන්ට ආරාධනා කර තම සමිතියට නව ශක්තියක් ලබා දීමට තීරණය කරන ලදී.

2019 අප්‍රේල් 21 වැනි දින, ඉස්ලාමීය අන්තවාදී කණ්ඩායමක් විසින් කතෝලික පල්ලි තුනක් සහ හෝටල් පහක් ඉලක්ක කර ගනිමින් එල්ල කරන ලද මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවකින්, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක පුද්ගලයින් 258 දෙනෙකු මිය යන ලදී. බෝම්බ ප්‍රහාරවල ප්‍රතිවිපාක රට පුරා දැනෙන්නටත් මුස්ලිම් ප්‍රජාව ප්‍රචණ්ඩත්වයේ සහ වෛරයේ ඉලක්ක බවට පත් වෙමින් පැවතුනු පසුබිමක මෙම වැඩසටහන පැවැත්වීම විශේෂ සිදු වීමක් ලෙස දැක්විය හැකිය.

2002 වසරේ යශෝධා කාන්තා සමිතිය පිහිටුවීමට පුරෝගාමී වූ 66 හැවිරිදි ප්‍රේමලතා උඩගම පවසන්නේ “ඒ වකවානුවේ ගොඩනැගුනු ක්‍රෝධය සහ අවිශ්වාසය සමඟ මිනිසුන්ට ජීවත් වීමට සිදුවුනත් කිලෝමීටරයක පමණ දුරකින් වාසය කරන මුස්ලිම් ජනතාව සමඟ අපිට විශාල සම්බන්ධයක් හෝ ගැටුමක් තිබුණේ නැහැ. රටේ අනෙක් ප්‍රදේශවල සිදුවන ගැටුම් සහිත ප්‍රවණතාවය අප වෙත ළඟා වෙමින් පවතිද්දී ගැටුම් ඇතිවීම වැළැක්විය යුතු බව අපට වැටහෙන්නට පටන් ගත්තා. අපට ඕනෑ වුනා අප අතර විශ්වාසය ගොඩනඟා ගන්නට.”







මුස්ලිම් කාන්තාවන්ට කණ්ඩායමට එක්වන ලෙස ආරාධනා කිරීමෙන් විශාල වෙනසක් වුනා

34 හැවිරිදි එස්. සරීෆා සමූහයේ නව සාමාජිකාවකි. "ප්‍රහාරයෙන් පසු අපට එරෙහිව මිනිසුන්ගෙන් යම් කෝපයක් ඇති වූ බව අපට දැනුනා වාගේම රටේ බොහෝ ප්‍රදේශවල මුස්ලිම්වරුන් ඉලක්ක බවට පත් වූ විට අපටද එනිසා විශාල කණගාටුවක් ඇති වූ බව කිව යුතුයි. අපේ ගමේ අපේ ප්‍රජාව අඩුවෙන් හිටියත් කිසිම ප්‍රචණ්ඩකාරී ප්‍රතිචාරයක් තිබුණේ නැහැ. මේ සමූහය හරහා අපේ සිංහල සහෝදරියන් සමඟ ශක්තිමත් මිත්‍රත්වයක් ගොඩනගා ගැනීමට හැකිවීම ගැන මම සතුටු වෙනවා."

ජාතික සාම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරෙන SCORE වැඩසටහන මගින් මෙම මුලපිරීම සඳහා පහසුකම් සපයනු ලැබුවේ ජනතාව වඩාත් සැලකිලිමත් වන ගැටළු හඳුනාගැනීම සඳහා සිදු කරන ලද ප්‍රජා තක්සේරුවකින් පසුවය. එහෙත් ඊට පෙරත්, සමාජ සංහිඳියාව ගොඩනැගීමේ විවිධ පැතිකඩ පිළිබඳ දින හතක ගැඹුරු වූ පුහුණු වැඩසටහනකට පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් මෙන්ම ප්‍රාදේශීය හවුල්කරුවන් ද සහභාගි වූහ.

බුත්තල SCORE ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කළ ශාන්ති කුසුම් ද මෙම සත් දින පුහුණුවට සහභාගී විය: "පුහුණුවේ වැදගත්ම කොටස ලෙස මට හැඟුනේ ගැටුම් නිරාකරණයට සම්බන්ධ කරුණුයි. මතුපිටින් සමහර ප්‍රශ්න ගැටුම් රහිත බව පෙනුනත්, එය සැමවිටම එසේ නොවන බව මම දැනගත්තා. ආර්ථික හා සමාජීය අසමානතාවය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අසමානතාවයද ගැටුම් ඇතිකරන අතර සහජීවනයට තර්ජනයක් වන ආකාරය අපට තේරුම් ගන්න පුළුවන් වුනා. මම ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු හැටියට වසර 13ක් සේවය කර ඇතත් ගැටුමේ සංකීර්ණ ස්වභාවය මා අවබෝධ කරගත් පළමු අවස්ථාව මෙය ලෙස පැවසිය හැකියි."




බුත්තල ප්‍රදේශයේ ප්‍රජාවන් සමඟ වැඩ කිරීමට පෙර ශාන්ති කුසුම් සහජීවනය සහ ගැටුම් නිරාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගී විය

උඩගම ප්‍රජා තක්සේරුවේදී හෙළි වූයේ ගමේ බොහෝ මුස්ලිම් කාන්තාවන් නිවෙස්වලට කොටු වී සිටින බවයි. ඔවුන් රැකියාවට නොගිය අතර, ඔවුන්ගේ ප්‍රජාවෙන් ඔබ්බට සමාජීය හෝ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා පිටත්ව ගියේ කලාතුරකිනි. එමෙන්ම තක්සේරුව සිදු කරන විටත් වැඩි වශයෙන් පැමිණ සිටියේ මුස්ලිම් පිරිමින්ය. ගමේ ප්‍රජාව සමඟ වඩාත් ක්‍රියාශීලීව සම්බන්ධ වීමට කාන්තාවන් දිරිගැන්වීමේ අවශ්‍යතාවයට මෙම වැඩසටහන ප්‍රමුඛතාවය ලබාදුනි.

මුස්ලිම් කාන්තාවන්ගේ සංචරණය බොහෝදුරට ඔවුන්ගේ පරිසරයට සීමා විය. එයාලා අපි වගේ එයාලගේ ගෙවල්වලින් එළියට බැස්සේ නැහැ." ප්‍රේමලතා පවසන්නීය. "කාන්තා සමාජයක් ලෙස අපට අත්කරගතයුතු ජයග්‍රහණ අපි ඔවුන්ගේ නිවෙස්වලට ගොස් පැහැදිලි කළා. අපට ඔවුන්ව දැන හඳුනා ගැනීමට අවශ්‍ය වුනා වගේම අපගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට අපට අවශ්‍ය වුනා. අපිත් එක්ක එකතු වෙන්න කියලා අපි එයාලට ඒත්තු ගැන්වුවා."

කාන්තාවන් සමාජ හා ආර්ථික සවිබල ගැන්වීම සහ බිම් මට්ටමේ සමාජ සම්බන්ධතා ශක්තිමත් කිරීම යන අරමුණු දෙක ඒකාබද්ධ කරමින් SCORE කාන්තා කණ්ඩායම සඳහා 'සහජීවනය තුළින් ව්‍යාපාරික නායකත්වය' යන මැයෙන් පුහුණු වැඩමුළුවක් සංවිධානය කරනු ලැබුවේ බහු සංස්කෘතික සන්දර්භයක් තුල පොදු ඉලක්ක සාක්ෂාත් කරගැනීම අරමුණු කරගෙනයි. සන්නිවේදකයෙකු, සාකච්ඡාකරුවෙකු, ජාලගත වන්නකු සහ සම්බන්ධීකාරකයෙකු වශයෙන් නායකයෙකුගේ භූමිකාව පිළිබඳව සහභාගිවන්නන් සාකච්ඡා කළහ. ආර්ථික ප්‍රගතිය සහ සමාජ සංහිඳියාව සඳහා බහුවිධ පැතිකඩයන් සලකා බැලීමේ වැදගත්කම සහ එකමුතුව ක්‍රියාත්මක වීමේ වැදගත්කම යන්නෙහි වටිනාකම මෙයින් ඉස්මතු කරවනු ලැබුණි.

"අපි වැඩමුළුවට සහභාගී වුනා, එනිසා තිබෙන අවස්තාවන් මොනවාදැයි දැකගන්න පුළුවන් වුනා" සරීෆා පවසයි. "මම කවදාවත් කුඩා ව්‍යාපාරයකට සම්බන්ධ වෙලා නැහැ. මම කණ්ඩායමෙන් පිට පවා සිංහල සමාජය සමඟ සංවාද කරන්න පටන් ගත්තා. මම සතියකට දෙවරක් ඉඳිආප්ප විකිණීමට තීරණය කළා. මම පිටි ගන්නේ සිංහල කඩයකින්; ඔවුන් මට වට්ටමක් දෙනවා. මම ඉඳිආප්ප විකුණන්නේ මුස්ලිම් කඩයකට." යශෝධා සමිතියේ ඇයගේ සාමාජිකත්වය පරිවර්තනීය ලෙස සරීෆා දකින්නීය: "එය මගේ ජීවිතය වෙනස් කළා. මම කවදාවත් රැස්වීමක් මඟහරින්නේ නැහැ. මගේ දරුවා අසනීප වුනාම වගේ වෙලාවල් වලට, මට ගොඩක් දුක හිතෙනවා වගේම ගෙදර ඉන්නකොට මට පොඩි පීඩනයක් දැනෙනවා. නමුත් අපේ කණ්ඩායම මුණගැහුනම ඒ ප්‍රශ්න නෑ වගේ දැනෙන්නේ. මේක කාන්තාවන්ට හොඳයි."



වැඩමුළුව තුළදී පුළුල් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය නොමැතිකම පිළිබඳව සාමාජිකයින් සාකච්ඡා කරන ලද අතර, ක්‍රමයෙන් අවබෝධය, මිත්‍රත්වය සහ අන්‍යෝන්‍ය ගෞරවය ගොඩනඟා ගන්නට කටයුතු කරන ලදි."අපේ කණ්ඩායමේ උගත් මුස්ලිම් කාන්තාවන් කිහිප දෙනෙක් ඉන්නවා, අපේ ක්‍රියාකාරකම් සැලසුම් කරන්න එයාලා උදව් කරනවා," ප්‍රේමලතා පැවසීය. "මගේ මුස්ලිම් සහෝදරියන් මගේ මල්පැළ අලෙවිකරණ ව්‍යාපාරයේ විකුණුම් ඉහළ නැංවීමට උදව් කරනවා. ලඟදී දවසක ඇන්තූරියම් මිලදී ගන්න අම්පාරේ ඉඳලාත් කට්ටියක් ආවා."

සරීෆා කුඩා ආහාර සැපයුම් ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ඇයට එම ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් දියුණු කිරීමේ බලාපොරොත්තුවක් ඇත

යශෝධා කාන්තා සමිතියේ සිංහල සාමාජිකාවෝ තම මුස්ලිම් සහෝදරියන්ට ගමේ පන්සලට එන ලෙස ආරාධනා කිරීමට තීරණය කළහ. "මුස්ලිම් අය කවදාවත් අපේ පන්සල්වලට එන්නේ නැති තරම්. එයාලා පන්සලේ කාලය ගතකරන්න ගොඩක් කැමති වුනා, එයාලා අපට පන්සල් භූමිය පිරිසිදු කරන්න උදව් වුනා, කොසු, බුමුතුරුණු එහෙමත් පරිත්‍යාග කළා. නායක ස්වාමීන් වහන්සේ එයාලාව පිළිගත්තා. ඉන්පස්සේ අපි පල්ලියට ගොස් පල්ලියේ පරිශ්‍රය පිරිසිදු කර මවුලවිවරුන් සමඟ කතා කළා. තවත් අවස්ථාවක අපි මුස්ලිම් ගායක මොහිදීන් බෙග්ගේ බෞද්ධ භක්ති ගීත ගායනා කළා. අපි සහෝදරත්වයෙන් ශක්තිමත් හැඟීමක් ගොඩනඟාගෙන තියෙනවා. එය පැහැදිලි කිරීමට අපහසුයි, ඒත් ඒක අපට මහත් සතුටක්.



ප්‍රේමලතා ඇගේ නව වැනිලා පැළ වගාව රැක බලා ගන්නා අතර එමඟින් ඇය වැඩි ලාභයක් උපයයි

# ධනාත්මකව ගැටුම් පරිවර්තනයේ යෙදෙන තරුණ ප්‍රජාව

“මදුරකැටිය කුඩා ගම්මාන දුසිමකින් සමන්විතයි. අපේ ගම සිංහල ගම, ඊට මදක් ඔබ්බෙන් දෙමළ ගම, එහා පැත්ත සම්පූර්ණයෙන්ම මුස්ලිම් ගමක්. ගම්මාන කිලෝමීටරයකටත් වඩා අඩු ප්‍රමාණයකින් වෙන් වී ඇත, නමුත් අපි එකිනෙකා දැන සිටියේ යන්තම් ය, “28 හැවිරිදි හසිත චතුරගේ පවසන්නේ භූගෝල විද්‍යාවට වඩා ජාතිය, ආගම සහ භාෂාව අනුව මිනිසුන් දුරස් කළ හැකි බවයි. ”

ශ්‍රී ලංකාවේ දශක තුනකට ආසන්න කාලයක් මුළුල්ලේ පැවති යුද්ධය 2009 දී අවසන් වූ නමුත් එහි බොහෝ හේතු බීජ සහ බලපෑම් අදටත් පවතී. රටේ තාරුණ්‍යය අසමානතාවයට හා බෙදුම්වාදී දේශපාලනයට සම්බන්ධ අනාරක්ෂිත භාවය සහ අවදානම් භාවය අඛණ්ඩව අත්විඳියි. ඔවුන් වෙනස් යැයි සැලකෙන පුද්ගලයන් පිළිබඳව සැකයෙන්, අවිශ්වාසයෙන් හා බියෙන් සිටිති - එය භයානක තත්ත්වයකි.

“සාමය ගොඩනැගීම සඳහා තරුණ නායකයින්” 2020 පෙබරවාරි මස මොණරාගල දිස්ත්‍රික්කයේ මදුරකැටිය ග්‍රාම නිලධාරී වසමේ ජාතික සාම මණ්ඩලය විසින් සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය (SCORE) වැඩසටහන හරහා පවත්වන ලද අන්තර් ක්‍රියාකාරී වැඩමුළුවකි. ප්‍රචණ්ඩ ගැටුමක සිට තිරසාර සාමය ගොඩනැගීම දක්වා සංක්‍රමණය වීමේදී තරුණයින් විසින් ඉටු කළ යුතු කාර්යභාරය එහිදී හඳුනා ගැනුණි.



සහභාගී වූ බොහෝ දෙනෙකුට මෙම වැඩමුළුව සම්පූර්ණයෙන්ම නව අත්දැකීමක් විය

හසිත චතුරගේ වැඩමුළුවට සහභාගි වූ තිස් හය දෙනාගෙන් එක් අයෙකි: "කෙලින්ම, මගේ සිතට කාවැදුණේ මා තරම් තරුණ වයසේ වූ පහසුකම් සපයන්නා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම කතා කිරීමයි. ඒ විතරක් නෙවෙයි, සන්නිවේදනය පහසු කරන්න පරිවර්තකයෙකු සැමවිටම ළඟින් හිටියා. අපට ඇතිවූ සැකමුසු තැන් වගේම අභිප්‍රේරණ ගැන කතා කරන්න අපට අවකාශය ලබා දුන්නා. දෙමළ නංගිලා මල්ලිලාත් දීර්ඝව කතා කළා. අපි ඔවුන් කියන දේට ඕනෑකමින් ඇහුම්කන් දුන්නා වගේම අපේ වෙනස්කම් ප්‍රශ්නයක් කර නොගත යුතු බව අපි තේරුම් ගැනීමට පටන් ගත්තා. අපිව වෙන් කරලා තියන්නේ දේශපාලකයන් කරන කියන දේවල්, ඒ සම්බන්ධයෙන්  මම ඔවුන්ට දොස් කියනවා."

විසිතුන් හැවිරිදි නිශාමාලි ගුරුවරියක් ලෙස සුදුසුකම් ලැබීමට ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයට ඇතුළත් වීමට බලාපොරොත්තුවෙන් සිටින්නීය. "මම සහජීවනය පිළිබඳ සංවාදවලට සහභාගි වූ පළමු අවස්ථාව මේක. අපි ඉස්සර සිංහල මිනිස්සුන්ට ටිකක් බයයි. මුලදී තරමක ආතතියක් තිබුණත් දවස අවසන් වෙනකොට ඒ ඔක්කොම වෙනස් වුනා. අපි එකිනෙකා එක්ක සුහද වුනා වගේම එයාලට සවන් දුන්නා. මේ වැඩමුළුව කෙරුණේ ගොඩක් අමුතු විධියට - අපි බොහෝ දුරට එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් වගේම ක්‍රීඩා හරහා ඉගෙන ගත්තා. අපි කම්මැලි නොවී උනන්දුවෙන් වැඩ කටයුතුවල නිරත වුණා."



සහජීවනය පිළිබඳව අවබෝධ කර ගැනීම සහ ගැටුම් නිරාකරණය මෙම වැඩමුළුවේ වැදගත් අරමුණු දෙකක් විය

"සහභාගීවන්නන් කණ්ඩායම් පිහිටුවා ගත්තා වගේම ඔවුන්ගේ අරමුණ සාක්ෂාත් කර ගනිමින් කණ්ඩායම් වැඩ කිරීම මූලික වුනා," පහසුකම් සපයන්නා වන තුසන්ද්‍ර විජයනාදන් පවසයි. "එයාලා එකිනෙකාගේ ඉදිරි දර්ශන සහ අභිප්‍රේරණ බෙදා ගත්තා. ඔවුන් එකිනෙකා  අවබෝධ කර ගැනීමේ ක්‍රියාකාරකම්වල නිරත වුණා. පසුව, ක්‍රීඩාවක් හරහා, එකිනෙකා එකඟ නොවන අවස්ථාවන්ට මුහුණ දීමට සලස්වා, එතුළින් මෙරට ජාතික ගැටලුව පිළිබඳව ඔවුන්ට අවබෝධ කර දුන්නා."

වසර ගණනාවක් තිස්සේ නිශාමලී සහ හසිත යන දෙදෙනාම තම පවුල්වල අවශ්‍යතා ගැටගසා ගැනීමට අරගල කර ඇත. ඔවුන්ගේ ජීවිතයේ දුෂ්කරතාවයන් යුද්ධයෙන් නරක අතට හැරී ඉන් ඔබ්බටද යමින් පවතියි. නිශාමලීගේ පියා කම්කරුවෙකු වන අතර ඇගේ මව ඇඟලුම් කම්හල් සේවිකාවකි. හසිතගේ පියා ත්‍රිරෝද රථ රියදුරෙකු වන අතර මව රසකැවිලි අලෙවි කරන්නියකි. හසිත පහුගිය අවුරුදු කීපයේ බස් කොන්දොස්තර කෙනෙක් ලෙස කටයුතු කළ අතර දැනට ත්‍රීරෝද රථ රියදුරෙක් වශයෙන් ද ක්‍රියා කරයි. දරිද්‍රතාවය ගැටුමට දායක වන සාධකයක් මෙන්ම එහි ප්‍රතිවිපාකයක් බව ඔහු විශ්වාස කරයි. "අපේ ගම දුප්පත්. අපි අසමානතාවය සහ අසාධාරණය අත්විඳිනවා වගේම ඒ තුලින්ම ගැටුම් ඇති වෙනවා. මොණරාගල විතරක් නෙවෙයි රටේ අනිත් මිනිස්සු අතරෙනුත් වැඩියෙන්ම පීඩාවට පත්වන්නේ දුප්පතුන්. දිළිඳුකම කියන්නේ මොකක්ද, ප්‍රචණ්ඩ ගැටුම් කියන්නේ මොකක්ද කියලා අපි දන්නවා. මට මතකයි යුද්ධය පැවති කාලයේ අපේ අසල්වැසි ප්‍රදේශවල සිංහල හා දෙමළ මිනිසුන් අතර ගැටුමක් ඇති වුණා. මට ඒ වගේ ගොඩක් දේවල් මතකයි."

"සාමය ගොඩනැගීම සඳහා තරුණ නායකයින්" වැඩමුළුවට ගැටුම් වැළැක්වීම සහ විසඳීම පිළිබඳ සාකච්ඡා ඇතුළත් විය. සමාජ ඒකාග්‍රතාවය සහ සාමය වෙනුවෙන් කටයුතු කිරීම, සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී තරුණයින් මුහුණ දීමට ඉඩ ඇති අභියෝගවලට මුහුණ දීම සහ විශේෂයෙන්ම මිත්‍රත්වයන් ගොඩනගා ගැනීමට වැඩමුළුව තෝතැන්නක් විය.



එකිනෙකාගේ භාෂා තේරුම් ගැනීම සහජීවනය සඳහා වැදගත් බව නිශාමලී විශ්වාස කරයි

"අද වෙද්දී මට දෙමළ යාළුවන්ට වඩා සිංහල සහ මුස්ලිම් යාළුවෝ ඉන්නවා" නිශාමලී කියයි. "මම සාමාන්‍ය පෙළ දක්වා සිංහල ඉගෙනගෙන තියෙනවා වගේම සිංහල භාෂාව චතුර ලෙස කතා කරන්න පුළුවන්. අපි එකිනෙකාගේ භාෂා තේරුම් ගැනීම වැදගත්. ඒවගේම සිංහල මිනිස්සු දෙමළ කතා කරන්න ඉගෙන ගන්නවා නම් හොඳයි. දෙමළ මිනිස්සු රජයේ කාර්යාලවලට ගියාම එයාලට උදව් කරන්න තරම් දෙමළ කතා කරන අය නැති බව මම දන්නවා. අපේ දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීම කොතරම් අවශ්‍ය දැයි මම දන්නා නිසා මගේ ඉගැන්වීමේ සුදුසුකම් ලැබීමෙන් පස්සේ මට ආයේ මගේ ගමට යන්න ඕනේ."

"මම කැමතියි ක්‍රීඩාව තුලින් මිනිස්සු එකතු කරන්න," හසිත පවසයි. "ඒක තමයි මම දන්න හොඳම විදිහ. මට වඩා වයසින් අඩු තරුණයන් ගැනත් මම සැලකිලිමත් වෙනවා. එයාලා අමාරුවේ වැටෙයි කියලා මට බයයි. එයාලව ක්‍රීඩා කටයුතුවලට ඇතුළත් කර ගැනීමයි මගේ ප්‍රාර්ථනාව. අපි දැනටමත් ක්‍රීඩා පිටියක් සකසන්න හොඳ ඉඩමක් එළිපෙහෙළි කරන්න පටන් අරගෙන තියෙන්නේ, ඒත් අපට එතන තියෙන ලොකු ගල් කීපයක් අයින් කරන්න තියෙන නිසා ඒකට පිට අයගෙන් උදව්වක් ඕනෑවෙනවා. ක්‍රීඩාව වෙනුවෙන් මෙම අවකාශය නිර්මාණය කිරීම වගේම එකට එකතු වෙන එකෙන් වෙනසක් වෙයි කියලා මට හිතෙනවා. මේ විධියට අපි හොඳ දෙයක් කරන්න වගේම වැදගත් ගැටළු ගැන කතා කරන්නත් නැඹුරු වෙයි."

මිනිසුන් දුරස් කරන්නට දේශපාලනය මොන තරම් කාර්යභාරයක් කරනවාදැයි හසිත හොඳින්ම දනියි



# සීමා තරණය කිරීම

## ගැටුම් වෙනුවට සහයෝගීතාවය තෝරාගත් සේරුවිල සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන්

1980 ගණන්වල ජනවාර්ගික ගැටුම උත්සන්න වීමත් සමඟ 'මායිම් ගම්මානය' යන යෙදුම ශ්‍රී ලංකාව තුළ බහුලව භාවිතා වීමට පටන් ගැනුණි. මායිම් ගම්මාන පිහිටා ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත්වල මායිම්වලට ආසන්නවය ය, නැතහොත් ඒ වකවානුවේ හමුදා සහ එල්ටීටීඊ පාලන ප්‍රදේශ අතර මායිම් රේඛා අතරය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුවිල කොට්ඨාශය ජනවාර්ගික වශයෙන් විභේදනය කළ හැකි මායිම් ගම්මාන 16 කින් සමන්විත වේ. උදාහරණයක් ලෙස නාවක්කේනිකාඩු සම්පූර්ණයෙන්ම මුස්ලිම් ගම්මානයක් වන අතර සුමේධංකරපුර සිංහල ගම්මානයකි. මෑත වකවානුවේදී එම අසල්වැසි ගම්මාන දෙක අතර වඩ වඩාත් ගැටුම්කාරී තත්වයන් ඇති විය.



නාවක්කේනිකාඩු ප්‍රදේශයේ ජනතාව ප්‍රධාන වශයෙන් සත්ව පාලනයේ නියැලෙන්නන් ය.



සුමේධංකරපුර වැසියෝ ප්‍රධාන වශයෙන් තම ඉඩම්වල ගොවිතැන් කරති.

"අද වනවිට සේරුවිල කොට්ඨාශයේ ජනගහණයෙන් 60%ක් පමණ සිංහලයන් වන නමුත් නාවක්කේනිකාඩු ප්‍රදේශයේ නිවාස 1000කට ආසන්න ප්‍රමාණයක්ද සුමේධංකරපුර ප්‍රදේශයේ 200කට අඩු ප්‍රමාණයක්ද ඇත" යනුවෙන් ජාතික සාම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරෙන සමාජ ඒකාබද්ධතා සහ සංහිඳියා (SCORE) වැඩසටහනේ ප්‍රජා සම්බන්ධක පී.නිරෝෂා පවසන්නීය. "නාවක්කේනිකාඩු වැසියන් ගවයන් ඇතිකරන අතර සුමේධංකරපුර වැසියන් තම ඉඩම්වල වගා කරති. ජන ඝනත්වය අධික වීම නිසා බෝග වගා කිරීමට ඉඩ කඩම් නොමැති මුස්ලිම් ගම්මානයේ ගවයන් ආහාර සොයාගැනීම සඳහා ජනඝනත්වය අඩු සිංහල ගම්මානයේ භූමියට අයාලේ යාමට පටන් ගත් විට, එය ගැටුමකට මුලපිරීමක් බව අපට තේරී ගියා."

1948 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් ශ්‍රී ලංකාව නිදහස ලැබූ දා සිට, දැවැන්ත වාරි ව්‍යාපෘති හා සම්බන්ධ වූ රජයේ ජනපදකරණ ප්‍රයත්නයන් යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ජනපදකරණයට ලක්විය. ඓතිහාසික වශයෙන් ත්‍රිකුණාමලය බොහෝ දුරට දෙමළ භාෂාව කතා කරන පිරිස වාසය කල ප්‍රදේශයක් වූ අතර, දෙමළ සහ මුස්ලිම් ජනගහණයන් සිංහලයන්ට වඩා වැඩි විය. එහෙත් යුද්ධය පැවති සමයේ මෙම ප්‍රදේශ ස්වාරක්ෂක කලාප ලෙස හමුදාකරණයට ලක්කළ අතර රජයන්ගේ ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රතිපත්ති සමඟ පළාතේ ජන විකාශය වෙනස් වීමට පටන් ගත්තේය. එබැවින් මෙම කලාපයේ සිටින බොහෝ සිංහලයන් සාපේක්ෂව මෑත කාලීනව පැමිණි අය වෙති.

සුමේධංකරපුර ජනාවාසය 1984 දී ඇති කරන ලදී. වසර දෙකකට පසු සෑම නිවසකටම රජයෙන් කුඹුරු අක්කරයක් සහ ගොඩ ඉඩම් හෙක්ටයාරයක් ලැබුණි. නමුත් යුද්ධය තීව්‍ර වීමත් සමඟ මිනිසුන් විශාල වශයෙන් තම නිවෙස් හැර යාමට පටන් ගත් අතර යුද්ධය අවසන් වූ පසු ආපසු පැමිණියේ ඔවුන්ගෙන් කිහිප දෙනෙකු පමණි. "මම 2009 ඉඳන් ගමේ පදිංචිකරුවෙක්. අපේ වගාවන් විනාශ කරන හරක් විශාල ප්‍රශ්නයක් වුණා. අපෙන් ගොඩක් අය උපයන්නේ ගොඩක් අඩු මුදලක් නිසා නැති වෙන ආදායම හොයාගන්න අමාරුයි" ස්වාමිපුරුෂයා හමුදාවේ සේවය කරන ගැහැණු ළමයින් දෙදෙනෙකුගේ මවක් වන 30 හැවිරිදි නයෝමි නිසංසලා පවසයි. "මේ වැඩේට නාවක්කේනිකාඩු ප්‍රදේශයේ හැම දෙනාම වගකිව යුතු නැති බව අපි දන්නවා, ඒත් අපි එයාලගේ භාෂාව කතා කරන්නේ නැහැ, අපි එයාලගේ සංස්කෘතිය දන්නේ නැහැ, අපි එයාලව දකින්නේ පුද්ගලයන් ලෙස නෙවෙයි කණ්ඩායමක් ලෙසයි. ඒ නිසා අපි ඒ මුළු ගමම වගකිව යුතුයි කියලා චෝදනා කළා."




අන්‍යෝන්‍ය අවබෝධය නැති නිසා ගැටුම් ඇතිවෙන බව නයෝමි නිසංසලා පිළිගනී

අපේ ප්‍රදේශයෙන් ගවයන් ඔවුන්ගේ ප්‍රදේශයට අයාලේ යාම සිදු වුනා," එම්. උබයිතුල්ලා නාවක්කේනිකාඩු - ගමේ හිටපු ග්‍රාම නිලධාරී. "එක පැත්තකින් මිනිසුන් තම ගවයන් පෝෂණය කරන්න ඕනේ, අනෙක් පැත්තෙන් මිනිසුන් තම වගාවන් ආරක්ෂා කරගන්න ඕනේ. අපට ප්‍රවේශ වෙන්න පුළුවන් තණබිම් ඉතා අල්පයි, ඒත් සුමේධංකරපුර ප්‍රදේශයේ පදිංචිකරුවනුත් ජීවත් වීමට අරගලයක් කරන බවත් එයාලගේ වගාවන් විනාශ වුනොත් ඒකෙන් විනාශයක් විය හැකි බවත් තේරෙනවා. මේ ගැටලුවට විසඳුමක් හොයාගන්න අපට අවශ්‍ය වෙලා තිබුනා, ඒ ගැන සාකච්ඡා ආරම්භ කිරීමට ලැබීම ගැන අපි සතුටු වුණා."

2019 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී, SCORE විසින් නාවක්කේනිකාඩු සහ සුමේධංකරපුර ප්‍රදේශයේ පදිංචිකරුවන්ට අතීතයෙන් පාඩම් ඉගෙන ගැනීමටත් ඔවුන්ගේ ගැටලු සාමූහිකව සංවේදනය කිරීමටත්, සානුකම්පිතව අවිහිංසාවාදී ලෙස විසඳීමටත්, එක්දින සංවාද සහ අභ්‍යාස පවත්වන ලදී. ප්‍රජා සාමාජිකයින්, විවිධ වයස්වල සහ වෘත්තීන්හී නියැලෙන කාන්තාවන් සහ පිරිමින් මෙන්ම ගමේ නායකයින් රැස්වීම්වලට සහභාගී කරවා ගැනුණී. සාකච්ඡා, තීරණ සහ අත්කරගනු ලබන ප්‍රගතිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් ඇතුළු රජයේ නිලධාරීන් දැනුවත් කරන ලදී.

ආරම්භයේ දී, සහභාගිවන්නන් යුද්ධය හා බැඳුනු ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුනරාවර්ජනය කළහ. කණ්ඩායම් වලට බෙදී, මිනිසුන් තම පුද්ගල සහ සාමූහික අත්දැකීම් සාකච්ඡා කර සොයාගැනීම් කණ්ඩායම් සියල්ලට ඉදිරිපත් කළහ. ඉන් අනතුරුව සම්පත් දායකයාගේ මැදිහත්වීම සහිත සාකච්ඡාවක් පැවැත්විණි. ඉන්පසුව, අනෙකුත් ප්‍රජාවන් අත්විඳින ප්‍රචණ්ඩත්වය සහ අලාභය

හෙළි කරන වීඩියෝ කිහිපයක් පෙන්වනු ලැබූ අතර, සහභාගිවන්නන් අනෙක් අයගේ කථාවලට සවන් දෙමින් ඔවුන්ගේ හැඟීම්බර ප්‍රතිචාර බෙදාහදා ගත්හ. ප්‍රචණ්ඩ ගැටුම් නැවත ඇති නොවීමට වගබලා ගැනීමේ අවශ්‍යතාවය, ගැටලු විසඳීමට ප්‍රචණ්ඩත්වයට යොමු වීමේ අහිතකර ප්‍රතිවිපාක සහ ආරවුල් විසඳීමට අවිහිංසාවාදී ප්‍රවේශයන් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳ සංවාදයක් ඇති කිරීමට මෙතුලින් හැකිවිය.

ඊළඟ සැසියේදී, සහභාගිවන්නන් නැවත වරක් කණ්ඩායම්වලට වෙන්වූ අතර ගැටුමක් පිළිබඳව කියවෙන කතාවක් නියෝජනය කරන කාඩ්පත් කට්ටලයක් ලබා දෙන ලදී. ඒවා අනුපිළිවෙලින් තැබීමට සහ එක් එක් කාඩ්පතට තනි වචනයකින් ශීර්ෂ පාඨය යොදන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබීය. ගැටුමක් ප්‍රචණ්ඩත්වයට විකාශය විය හැකි ආකාරයත් වෙනස් ආකාරයකින් ප්‍රවේශ වුවහොත් වෙනස් ප්‍රතිඵලයක් ලබා ගත හැකි ආකාරය පිළිබඳවත් සාකච්ඡා කිරීම මෙහි ප්‍රතිඵලය විය.

සෑම ප්‍රජාවක්ම ඉන්පසුව උක්ත ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කළහ. නාවක්කේනිකාඩු සහභාගිවන්නන් විසින් දැනට ප්‍රජාවන් දෙක අතර පවතින විරසකයට බලපා ඇති බොහෝ කරුණු සලකා බැලීය. ගමට අයත් විශාල ඉඩම් ප්‍රමාණයක් ප්‍රදේශයේ ප්‍රධාන විහාරස්ථාන දෙක වන වෙල්ගම් වෙහෙර සහ සේරුවාවිල රජමහා විහාරය විසින් අත්පත් කර ගෙන ඇති අතර මිනිසුන්ට වගා කිරීමට හෝ සතුන්ට ප්‍රමාණවත් ආහාර සොයා ගැනීමට අපහසු බව ඔවුහු සිහිපත් කළහ. එපමණක්ද නොව, සුමේධංකරපුරයේ වගා කිරීමට භාවිතා නොකළ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබූ බැවින්, සතුන් තණ කෑම සිදු කළ බව පෙනෙන්නට විය. එහෙත් අයාලේ යන සතුන් සුමේධන්කරපුරයට යාමෙන් වගාවන් විනාශ වූ නිසා සිංහල ගොවීන්ගෙන් ප්‍රචණ්ඩ වචන හා තර්ජන එල්ල වූ බවත් හඳුනා ගත්හ.

ගම්වාසීන් අතර පවතින දුර්වල සන්නිවේදනය පිළිබඳව ද ජනතාව කතා කළේ තරුණ පිරිසට දෙමළ භාෂාවෙන් කතා කිරීමට නොහැකි වීම ඔවුන් අතර පරතරයක් ඇති කිරීමට පිටිවහලක් වී ඇති බව පෙන්වා දෙමිනි.  මීට කලින් අපේ භාෂාව කතා කරන්න එයාලට පුළුවන් වුණා. ඔවුන් සිංහල-බෞද්ධයන් වුවද, ඔවුන් අපේ සංස්කෘතිය සහ විශ්වාසයන් තේරුම් ගත්හගත්තා "සෙයිබදු මොහොමදු හජීස් කියා සිටියේය.

සුමේධංකරපුර ප්‍රදේශයේ ජනතාව මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් ගැන කතා කළ අතර, පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව මුස්ලිම් ප්‍රජාව ගැන සැකයක් සහ නොසන්සුන්තාවයක් වර්ධනය වූ බව කියා සිටියහ. එහෙත්, ඇතැම් සහභාගිවන්නන් නාවක්කේනිකාඩු ප්‍රදේශවාසීන් සමඟ ගොඩනැගුණු මිත්‍රත්වය සහ විශ්වාසය පිළිබඳව ද කතා කළහ. "ෆයිසාල් මහතා සහ මම හොඳ මිතුරන්. මට එයාව විශ්වාස කරන්න පුළුවන්, එයාත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් නිසා මට මොකක් හරි ප්‍රශ්නයක් ආවොත් මම නිතරම එයා ගාවට යනවා" යැයි, සෙනරත් බණ්ඩාර මහතා පැවසීය.

සුමේධන්කරපුර ප්‍රදේශයේ සමගිය නොමැතිකම සහ අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට අපහසු වීම පිළිබඳව ද මෙම රැස්වීමේදී සාකච්ඡාවට භාජනය කෙරුණු අතර ප්‍රදේශවාසීන් කිහිප දෙනෙකු තම භාවිතයට නොගන්නා ඉඩම් ගවයින්ට උලා කෑමට ලබාදී එතුලින් ආදායමක් ගෙන ජීවිතය ගැට ගසා ගැනීමට කටයුතු කළ බව ද සඳහන් විය. නමුත් මෙම වැටක් නොමැති බිම් කැබලිවලින් ඉවත්ව ප්‍රදේශයේ අනෙකුත් වගා බිම් කරා යාමටත් මෙම ගවයන් පුරුදු වී ඇති බවද කියැවුණි.

එසේම අයාලේ යන ගවයන්ගේ ප්‍රශ්නයට රජය මැදිහත් වීමේ වැදගත්කම ද ජනතාව සැලකිල්ලට ගෙන තිබෙන බව පෙනී යයි. මෙහිදී නයෝමි නිසංසලා ගැටුම්කාරී විසඳුමක් යෝජනා නොකිරීම සුවිශේෂී කාරණයකි: "රජය නාවක්කේනිකාඩු ප්‍රදේශයේ මිනිසුන්ගේ සතුන්ට ආහාර ලබාගැනීමට ඉඩම් ලබා දෙනවා නම්, අපේ වගාවන් ආරක්ෂිත වෙයි. ඉවසීමේ අරුත අපට වඩා එයාලා දන්නවා කියලා හිතෙනවා. අපි ඒක අගය කරන්න ඕනේ. එසේ නොවුනොත් තත්වය භයානක වෙන්න පුළුවන්."

නාවක්කේනිකාඩු සහ සුමේධංකරපුරදී සිදුකරනු ලැබූ සංවාද මතින් පෙරහුරුවක යෙදවුණු දෙපිරිස 2019 දෙසැම්බර් මස පැවති ඒකාබද්ධ සාකච්ඡාවකට සුදානමින් සිටියහ. ගවයින්ට ආහාර ගැනීමට සුදුසු ඉඩම් හඳුනාගෙන ඒ පිළිබඳව රජයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට සහභාගි වූ පිරිස තීරණය කළහ. ඉන් පසුවත් ගවයන් අයාලේ ගොස් බෝග විනාශ  කරන්නේ නම්, පාඩුව සඳහා ගව හිමියන් විසින් වන්දි ගෙවීමටද ඔවුහු එකඟ වූහ.



SCORE ක්‍රියාකාරකම ප්‍රජාවන් දෙක එකට ගෙන ඒමට රුකුලක් විය. ඊට හේතුව වූයේ විරෝධය වෙනුවට සාකච්ඡාව තෝරාගැනීමයි

" මේක විශාල ගැටලුවක් නොවන බව සාකච්ඡාවෙන් පසුව, අපට වැටහුණා" යැයි එස්.එම්. උබයිතුල්ලා පැවසීය. "අසල්වැසි ගම එක්ක අපි විසඳා ගන්න ඕනෑ ප්‍රශ්න කිහිපයක් තියෙනවා, ඉඩම් ප්‍රශ්න වැනි දේ රාජ්‍ය නිලධාරීන් එක්ක අපි විසඳා ගත යුතුයි. අන්තිමට අපි හැමෝටම ඕනෑ වෙන්නේ සාමකාමී ජීවිතයක් ගත කරන්න. ඒ වගේම ගවයින් ගමන් කරවීමට මංපෙත් නියම කිරීමට අපි තීරණය කළා. නාවක්කේනිකාඩු සහ සුමේධංකරපුර අතර මාරුවෙන් මාරුවට අපි මාස්පතා රැස්වීම් පවත්වන්න පටන් ගත්තා - ඒත් අපට ඒ රැස්වීම් නිතිපතා කරගෙන යාමට නොහැකි වෙලා තියෙනවා.



ඇම් ඇස් උබයිතුල්ලා කියන්නේ සංවාදයක් නැතිවීම නිසා ප්‍රශ්න අතිශයෝක්තියෙන් බැලීම හෝ උග්‍ර විය හැකි බවයි

කෙසේ වෙතත්, ඔවුන් නිවැරදි මාවතක ගමන් කරන බව සෙයිබදු මොහොමදු හෆීස් විශ්වාස කරයි. "මුස්ලිම් පල්ලියේ පරිපාලන කමිටුව, ග්‍රාම නිලධාරී සහ සමෘද්ධි නිලධාරි මීට කලින් මේ ගැටලුව විසඳන්න මැදිහත් වෙන්න බැලුවත් ඒ සියලු උත්සාහයන් අසාර්ථක වුනා. මේ වැඩසටහන තමයි හැරවුම් ලක්ෂ්‍යය. අපේ පොදු ගැටළු ගැන කතා කරන්න අපිට හවුල් වේදිකාවක් අපි හදාගත්තා."

සුමේධංකරපුර සෙනරත් බණ්ඩාරත් ඊට එකඟය. මිනිසුන් දුරස් කරන වැරදි මත ආමන්ත්‍රණය කිරීමට අවස්ථාවක් ඔහු මෙම වැඩසටහන හරහා දකියි. "මිනිස්සු නොමග යවලා ඕනෑම ප්‍රශ්නයක් ජනවාර්ගික ආරවුලක් බවට පත් කරන්න උත්සාහ කරන මුස්ලිම් නායකයන් වගේම සිංහල නායකයොත් ඉන්නවා. එයාලා බලන්නේ තමාගේ අසල්වැසියෝ සතුරන් ලෙස දැකීමට පොළඹවන්න. මේ අවිශ්වාසය, වෛරය පරද්දන්න හදන මම වගේ මිනිස්සු, බලය නැති මිනිස්සු එක්ක එකතුවෙලා වැඩ කරන්නයි මට ඕන. මනුෂ්‍යත්වය බලවත් දෙයක්. ජාතිවාදයට එරෙහිව සටන් කිරීමට හොඳම මාර්ගය ඒක."

ප්‍රජා සම්බන්ධක පී.නිරෝෂා ද මෙයට එකඟ වේ. "මිනිසුන් රැවටිල්ලට හසු වෙන්න පුළුවන් වගේම ඔවුන්ව මෙහෙයවන්න පුළුවන්. යුද්ධයෙන් පස්සේ මෙහෙට ආපු ගොඩක් තරුණ තරුණියන් තුළ තියෙන්නේ දැඩි කෝපයක්. එයාලා මෙහෙ ඇවිත් තියෙන්නේ වෙන රැකියාවක් හොයාගන්න බැරි වුනහම. එයාලා පැරණි පරම්පරාවන් කරපු හැටියට සහජීවනය තේරුම් ගන්නේ නැහැ. උදාහරණයක් හැටියට සේරුවාවිල රජමහා විහාරයට ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කරනකොට නායක හාමුදුරුවන් ආරක්ෂා කළේ දෙමළ සහ මුස්ලිම් ජනතාව බව එයාලා දන්නේ නැහැ."



ව්‍යාපෘතියේ ප්‍රජා සම්බන්ධක නිරෝෂනි විශ්වාස කරන්නේ සහජීවනයේ වටිනාකම තේරුම් ගන්න ජනතාව අතීත අත්දැකීම් ගැන වඩාත් හොඳින් දැනුවත් කළ යුතු බවයි

# ගැටුම නොව, සංවාදය

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ උතුරු දෙසින් පිහිටි වලිකාමම් හි කීරිමලෙයි නගුලේශ්වර මහා විද්‍යාලයේ විදුහල්පති ටී. තයානාදන් මහතා ප්‍රකාශ කරන්නේ "සහජීවනයේ වැදගත් අංගයක් වන්නේ ප්‍රචණ්ඩත්වයෙන් තොර සන්නිවේදනය බවයි. මෙම සංකල්පය ඔහුට අලුත් බවත්, මෑතක් වන තුරුම ඔහු ඒ ගැන නොසිතූ, නොඇසූ බවත් ඔහු පවසයි. "අපි මෙම විෂය පිළිබඳ වැඩමුළු පවත්වනකොට, සිසුන්, ගුරුවරුන් සහ මම එහි අදහස තේරුම් ගැනීමට පටන් ගත්තා. දවස අවසානයේදී, මිනිසුන් සමඟ සංවේදනය කිරීම වගේම සන්නිවේදනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ වැදගත්කම අපට දැකගන්න පුළුවන් වුනා. ප්‍රචණ්ඩ ගැටුම්වලින් තොර සමාජයක් ගොඩනැගීමට මේක හොඳ පදනමක් කියා සිතුණා. "



කීරිමලෙයි නගුලේශ්වර මහා විද්‍යාලයේ සිසුන් සහ ගුරුවරුන් සංවේදනය සමඟ සන්නිවේදනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්නට පටන් ගන්නා ලදී.

1980 ගණන්වල සිට යාපනය දිස්ත්‍රික්කයේ ඓතිහාසික වලිකාමම් ප්‍රදේශයේ ජනතාවට ප්‍රචණ්ඩ ගැටුම් එදිනෙදා දකින සාමාන්‍ය සිදුවීමක් විය. යුද්ධයේ බලපෑම වඩාත් දරුණුවත්ම එහි වැසියන් දහස් ගණනකට අවතැන් වන්නට සිදුවුයේ හමුදා කඳවුරු සහ ආරක්ෂක අංශවල ආරක්ෂාව සඳහා එහි විශාල භූමි ප්‍රදේශයක් අධි ආරක්ෂක කලාපයක් ලෙස මායිම් ලකුණු කිරීමත් සමඟය.

1990 ගණන්වල මුල් භාගයේ සිට, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වාසය කල ලක්ෂයකට අධික ජනතාවට තම නිවෙස් හැර යාමට සිදු වුයේ සන්නද්ධ හමුදා විසින් රාජ්‍ය හා පෞද්ගලික දේපළ නතු කරගැනීමත් සමඟය. මිනිසුන්ට ජීවත් වන්නට සිදුවුයේ සරණාගත කඳවුරු, තාවකාලික නිවාස හෝ දුර බැහැර ප්‍රදේශවල සිටි ඥාතීන් සමඟ අවිනිශ්චිත තත්ත්වයක ය.



වසර ගණනාවක් අවතැන්ව සිටි ජනතාව නැවත තම ගම්බිම් බලා යන ලදි

2009 වසරේ යුද්ධය අවසන් වීමත් සමඟ වලිකාමම් අධිආරක්ෂිත කලාපය තුළ තිබූ අක්කර 6000කට අධික ප්‍රමාණයක කොටස් සිවිල් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මුදා හැරීමට රජය කටයුතු කළේය. මිනිසුන් ක්‍රමක්‍රමයෙන් සිය පාරම්පරික ඉඩම් වෙත ආපසු යාමට පටන් ගත් අතර, එම ඉඩම් දශක ගණනාවක් මුළුල්ලේම පැවතුනේ ඔවුනට යාමට තහනම් කලාප වශයෙනි. "ළමා වියේදී පිටව ගිය අය වැඩිහිටියන් ලෙස ඔවුන්ගේම දරුවන් සමඟ ආපසු පැමිණෙමින් සිටියහ," යනුවෙන් සඳහන් කරනු ලැබුවේ යාපනයේ සංවර්ධන සේවකයෙකු වන පෙරිම්බනායගම් රොනිබස් මහතාය. "එය සංකීර්ණ තත්වයක් විය."

සමහර පවුල් ඔවුන්ගේ මුල් නිවාස අලුත්වැඩියා කරගත් අතර සමහරුන්ට තම නිවාස මුල සිටම යළි ගොඩ නගන්නට සිදුවිය. අනෙක් අය රජයේ ඉඩමක හෝ ප්‍රදේශයේ වූ වෙනත් ඉඩමක, රජය විසින් නැවත පදිංචි කරවන ලදි - නුහුරු නුපුරුදු අසල්වැසියන් සහිත ප්‍රදේශ නිර්මාණය කිරීම තුලින් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් මතුවන සාමාන්‍ය ගැටලු තවත් සංකීර්ණ ගැටළු බවට පත්විය. මෙම පවුල්වල ජීවිතවල අලුත් අවධියක ආරම්භය වූ මේ කාලය විශේෂයෙන් නොසන්සුන් විය.



"වලිකාමම් හි පිහිටි නකුලේශ්වරම් ගම්මානයට ආපසු පැමිණි මිනිසුන් දැන් අසල්වැසියන් වුවත් ඔවුන් එකිනෙකාගෙන් දුරස්ව සිටිති." යැයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරිනී දර්ශා ක්‍රිෂ්ණමෙනන් පවසයි. "ඔවුන් කුලය අනුව බෙදිලා. එය මතුපිටින් පෙනෙනවාට වඩා මදක් සැඟවී ඇති ප්‍රශ්නයකි. විවිධ කුලවල අය විවිධ කෝවිල්වලට වන්දනාමාන කිරීමට පුරුදු වී සිටියි. ඔවුන් මිශ්‍ර නොවේ, ඔවුන් සම්බන්ධ නොවේ, ඔවුන් සන්නිවේදනය නොකරයි - වරදවා වටහාගැනීම් සහ ගැටුම් නොවැළැක්විය හැකිය. ඔවුන්ට හඳුන්වා දීමට ප්‍රචණ්ඩත්වයෙන් තොර සන්නිවේදනය හොඳ විෂයක් බව අපි දැන සිටියෙමු.

සංවර්ධන නිලධාරී දර්ශා ක්‍රිෂ්ණමෙනන් කනස්සල්ලට පත්ව සිටින්නේ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය අනුව එය මිනිසුන් අතර ගැටුම් ඇතිවීමට මුලපිරීමක් විය හැකි නිසාය



ජාතික සාම මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද සමාජ ඒකාබද්ධතා සහ සංහිඳියාව SCORE වැඩසටහන මගින් වලිකාමම් ප්‍රදේශයේ පාසල් තුනක - සිසුන් සහ ගුරුවරුන් වෙනුවෙන් සාමය ගොඩනැගීම සඳහා අවිහිංසාවාදී සන්නිවේදනය (NVC) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු වෙන වෙනම පැවැත්වීමට තීරණය කරන ලදී. NVC යනු නව සන්නිවේදන ක්‍රමවේදයකි. එතුළින් මිනිසුන් අතර ශක්තිමත් සහ යහපත් සබඳතා ගොඩනඟා ගැනීමට පුළුවන්. එය විවේචනය හා දොස් කීම පසෙකලා සවන් දීම සහ කතා කිරීමට යොමු කරවයි. පරස්පර අදහස් උත්සන්න නොකර අපගේ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම ද මෙහිදී අත්‍යාවශ්‍ය වේ. අත්‍යවශ්‍යයෙන්ම, එය ජනතාව ඉගෙන ගත යුතු දෙයක්," ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කළ පෙරිම්බනායගම් රොනිබස් පවසයි. "ප්‍රජාවන් තුළ සහජීවනය ඇති කිරීම වගේම බාහිර පුද්ගලයින් එක්ක සංහිඳියාව ඇති කිරීමට වඩා හොඳ අවකාශයක් නිර්මාණය කරන්න එය උපකාරී වන බව අපට තේරෙනවා."

අවිහිංසාවාදී සන්නිවේදනය මත පදනම්ව පෙරිම්බනායගම් රොනිබස් පාසල් වැඩමුළු සම්බන්ධීකරණය කළේය

සන්නිවේදනයේ ඌනතාව, වැරදි සන්නිවේදනය සහ වැරදි අවබෝධය එකඟතාවයන්ට පැමිණීමට බාධා කරන අතර, ගැටුම් තීව්‍ර අවස්ථාවන්හිදී හරි ආකාරයේ සන්නිවේදනයක් නොමැති වීම සාමය ගොඩනැගීම අභියෝගයක් බවට පත් කරයි. මනෝවිද්‍යාඥයෙකු සහ මැදිහත්කරුවෙකු වූ මාෂල් රොසෙන්බර්ග් විසින් අවිහිංසාවාදී සන්නිවේදන සංකල්පය හඳුන්වා දෙනු ලැබුනේ සහකම්පනය ප්‍රවර්ධනය කිරීමටත් වෙනස්කම් නොසලකා මිනිසුන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමටත්ය. ගැටුම් ඇති පුද්ගලයින්ට ප්‍රචණ්ඩත්වයට පත් නොවී, නොරුස්සන සම්බන්ධතාවයක් ගොඩනගා ගන්නේ නැතිව අනෙකාගේ හැඟීම්, අවශ්‍යතාවයන්, ඉල්ලීම් සහ ඔවුන්ගේ වෙනස්කම් අවබෝධ කර ගනිමින් ගැටළු අවම කර ගැනීමට මෙම සංකල්පය මඟපෙන්වනු ලබයි.






සිසුන් සහ ගුරුවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදි

NVC ගැන වැඩමුළුවට ළමයින් විතරක් නොවේ ගුරුවරුත් සම්බන්ධ වුණා." ද්විතියික පාසල් සිසුවියක වන ප්‍රියා ජේකබ් පවසන්නීය. " ඉස්කෝලෙදි හරි ගෙදරදි හරි පොදු ස්ථානයකදි හරි අප සන්නිවේදනය කරන්න ඕනේ කොහොමද කියන එක ගැන අපි දැනුවත් වුණා. හැම සිකුරාදා දවසකම රැස්වීමේදී අපි අවිහිංසාවාදී සන්නිවේදනයේ අවශ්‍යතාවය ගැන ආවර්ජනය කරනවා. වැඩමුළුවේ අනපේක්ෂිත ප්‍රතිඵලයක් වුනේ ගුරුවරුන් සහ සිසුන් එකිනෙකා වඩා හොඳින් අවබෝධ කර ගැනීමයි."

අවිහිංසාවාදී සන්නිවේදනය ගැන පාසල් ප්‍රජාවම කතා කරන නිසා ප්‍රියා ජේකබ්ට ඉතාමත් සතුටුය



“අපි විවිධ ප්‍රචණ්ඩත්වයන්ට දිගින් දිගටම මුහුණ දෙන සමාජයක ජීවත් වෙනවා. අපි මීට කලින් කවදාවත් මේ විධියට සාකච්ඡා කර තිබ්බේ නැති මේ ප්‍රශ්න ගැන කතා කරන්න අපි වැඩමුළුව අවස්ථාවක් කර ගත්තා,” ප්‍රාථමික පාසලේ ප්‍රධානී සිවරාජා ගෞරිදරන් පවසයි. “ගැටුම් නිරාකරණය සඳහා මෙම පරම්පරාව ප්‍රචණ්ඩත්වයෙන් ගලවා ගත යුතුයි. අපි සහජීවනයෙන් ඉන්න ඕන. කොවිඩ්-19 නිසා පාසල දිගු කලක් වසා දැමුවම, දරුවන්ට එයාලගේ ගෙවල්වලට සීමා වෙන්න සිදුවුනා. මෙම දුෂ්කර කාලේදී එයාලා ගෙවල්වල අවිහිංසාවාදී සන්නිවේදනය භාවිතා කරයි කියලා මට විශ්වාසයි.”

සත්‍ය වශයෙන්ම අවිහිංසාවාදී සන්නිවේදනය සම්බන්ධ කුසලතා ඔවුන් භාවිතා කරන බව ගුරුවරියක වන වසන්තා කුමාරි රාමචන්ද්‍රන් සනාථ කරයි: “ළමයි වගේම අපි, වැඩිහිටියනුත් අවිහිංසාවාදී සන්නිවේදන සංකල්පය අපේ ගෙවල් වලදි ක්‍රියාවේ යොදා ගත්තා. අපි වැඩමුළුවෙන් පසුව මෙම විෂය සාකච්ඡා කිරීම නතර කළේ නැහැ. අපි ඒ ගැන දිගින් දිගටම සාකච්ඡා කරනවා. පාසැලේදී හෝ නිවසේදී හෝ වේවා, සිත් රිදවන වචන ප්‍රකාශ කරන විට, මම ඒක ඉදිරිපත් කරනවා. NVC හි වැදගත්කම ගැන සාකච්ඡා කරන එකම ගුරුවරයා මම නෙවෙයි කියලා මම දන්නවා. ප්‍රචණ්ඩත්වයෙන් තොර සන්නිවේදනය ගැන පෝස්ටර් නිර්මාණය කරලා ඒවා ප්‍රදර්ශනය කරලා සිසුන් 2019 අවුරුද්දේ සාම සතිය සැමරුවා.”




වසන්තා කුමාරි රාමචන්ද්‍රන් ගුරුතුමිය ඇගේ පවුලේ අය සමඟ ද අවිහිංසාවාදී සන්නිවේදනය ගැන සාකච්ඡා කළාය



පන්ති කාමරයක අලවා තිබූ පෝස්ටරයක, “සංවාදය මිස ගැටුම නොවේ” යනුවෙන් සඳහන් වේ. මෙය සිසුන් ඉගෙන ගත් දේ පැහැදිලිව පෙන්නුම් කරයි” යනුවෙන් විදුහල්පති තායනාදන් මහතා සඳහන් කරයි.

ටී. තායනාදන් විදුහල්පතිතුමා, පාසලේදී මෙම විෂය පිළිබඳ තවත් වැඩමුළු පැවැත්වීමට කැමැත්තක් දක්වයි




අවිහිංසාවාදී සන්නිවේදනය විෂයෙහි පෝස්ටර් පන්ති කාමරවල ස්ථිර අංග බවට පත්ව ඇත

# ප්‍රතික්ෂේප වූ ප්‍රචණ්ඩත්වය

අසල්වැසි ප්‍රදේශයේ වීදි නාට්‍ය ප්‍රසංගයක් සිදුකරන බැව් ත්‍රිරෝද රථයක සවිකර ඇති ශබ්ද විකාශන යන්ත්‍රයකින් නිවේදනය කරයි. මෙහිදී ළමයින්ට සහභාගී වීමට විශේෂයෙන් දිරිගන්වනු ලැබිණි. නාට්‍යය ආරම්භ වීමට පෙර ඔවුන් නාට්‍ය කණ්ඩායම සමඟ 'සාමය ගොඩනැගීම සම්බන්ධ' ක්‍රීඩා වලට සහභාගී වනු ඇත. රංගනය සහ එහි පණිවිඩය පිළිබඳ කෙටි සාකච්ඡාවකින් අවසන් වන ඊළඟ නාට්‍යයත් රස විඳින ලෙසට සියලුම ප්‍රේක්ෂක සාමාජිකයින්ට ආරාධනා කෙරේ.



SCORE සමාජ සන්නිවේදන ක්‍රියාවලියක් ලෙස වීදි නාට්‍ය භාවිතා කරනු ලැබුවේ බෙදී වෙන්වූ ප්‍රජාවන් එක්සත් කිරීමේ තීරණාත්මක අවශ්‍යතාවය සපුරාලීමටය

සෙම්මුගම් නාට්‍ය කණ්ඩායම විසින් 2019 වසරේ යාපනය සහ වවුනියා දිස්ත්‍රික්කවල සමාජ ඒකාග්‍රතාවය සහ සංහිඳියාව යන තේමාව යටතේ වීදි නාට්‍ය ප්‍රසංග මාලාවක් පවත්වනු ලැබීය. එය ජාතික සාම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද SCORE ව්‍යාපෘතියක මුලපිරීමකි. “මට නම් නාට්‍ය කියන්නේ හඬක් නැගීමට අපොහොසත් මිනිස්සු වෙනුවෙන් හඬක් නඟන ක්‍රමයක්” කණ්ඩායමේ නායකයා වන 41 හැවිරිදි සත්‍යසීලන් පවසයි. ”සෑම නාට්‍යයක්ම යම් ආකාරයක ගැටුමක් වටා ගොඩනැගෙයි”




සත්‍යසීලන් 2004 වසරේ සිට යාපනයේ පළපුරුදු නාට්‍යකරුවන් යටතේ නාට්‍ය හැදෑරූ අයෙකි. නමුත් ඒ විෂය පිළිබඳ ඔහුගේ උනන්දුව ඊටත් එහාට ගමන් කරයි. “මම පොඩි කාලයේ ඉඳන්, ප්‍රාථමික පාසලේ ඉඳන් කලාවට නැටුම්, චිත්‍ර ඇඳීම, සංගීතය, නාට්‍ය ගැන උනන්දු වුණා. මමත් උනන්දුවෙන් කියවන කෙනෙක්. සංගීතඥයෙක් හා බටනලා වාදකයෙක් වූ මගේ පියාත් මට මේ ගමන පැමිණීමට හේතුවක් වුණා. මට වයස අවුරුදු 16 ක් වගේ වෙද්දී යුද්ධය දරුණු අතට හැරුනා. ඔවුන් වටා මිනිසුන් ඒකරාශී කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය නාට්‍ය භාවිතා කළා. දැන් අපි ගෙනියන්නේ වෙනස් ආකාරයක පණිවිඩයක්. නාට්‍ය තුළින් ඔබට පැහැදිලිව හඳුනාගත හැකි පණිවිඩ අපට පහසුවෙන් රැගෙන යා හැකියි.”

එහෙත් එය පහසු ක්‍රියාවලියක් නොවන බව සත්‍යසීලන් පිළිගනී. “සාමය ගැන නාට්‍යයක් නිර්මාණය කිරීම හැමවිටම අභියෝගයක්. එය එතරම් සංකීර්ණ ප්‍රශ්නයක්. ගැටලුව නම් මෙම ප්‍රදේශවල බොහෝ දෙනෙකුට තවමත් සාමය ළඟා කර ගැනීම ගැන එතරම් විශ්වාසයක් නොමැති වීමයි. ඔවුන් විශ්වාස කරන්නේ ගැටුම් පවතිනු ඇති බවත් සටන් නැවත ඇති වන බවත්ය. එවැනි සන්දර්භයක් තුළ සාමය ගැන කතා කිරීම අසීරු ය.”

කෙසේ වෙතත්, ඔහු නාට්‍ය තුළින් සාමය ගොඩනැංවීමේ ප්‍රයත්නයන්ට සහාය වෙමින් - නූතන ජීවන අත්දැකීම් උකහා ගනිමින් මෙම ක්‍රියාදාමය පවත්වාගෙන යනු ලබයි. ”ජාතික සාම මණ්ඩලය හමුවීම ඔහුගේ මේ ගමනේ කොටසක්. පිටපතක් ලියන්න කලින් අපි දීර්ඝ වශයෙන් කතා බහ කරනවා. ඒවායින් එකක, අපි අපේ අදහස තරමක් වක්‍රාකාරව ඉදිරිපත්

පශ්චාත් යුධ ගැටුම්කාරී වාතාවරණයක සහජීවනය සහ සාමය යන තේමාවන් පිළිබඳ බොහෝ ප්‍රශ්න තවමත් නොවිසඳී පවතින වටපිටාවක් තුල මෙවැනි නාට්‍ය නිර්මාණය කිරීම ගැටලු වලට තුඩුදිය හැකි බව සත්‍යසීලන් පවසයි



කිරීමට තීරණය කළා. එය වැඩිහිටියන්ගේ ඇඟිලි ගැසීම් සමඟ ප්‍රචණ්ඩත්වයට පත්වන අහිංසක හා හානිකර නොවන ළමා ක්‍රීඩාවක් වටා ගෙතුණු කතාවක් වේ. තවද මෙය ඉඩමකට ප්‍රවේශ වීම මූලික කරගෙන ඇති වූ ගැටුමක් පිළිබඳ කතාවකි. කුඩා එකඟ නොවීමක් අවසානයේ ගැටුමක් බවට පරිවර්තනය වී පසුව ප්‍රචණ්ඩත්වය කරා ළඟා වන්නේ කෙසේදැයි මෙහි පෙන්වා දෙනවා. බොහෝ කලකට පෙර ජාතියක් ලෙස අප අත්දුටු කතාවට මෙය බෙහෙවින් සමාන ය. මම විශ්වාස කරනවා ප්‍රේක්ෂකයින් කල්පනා කරන්න පටන් ගන්නවා, ඇයි අපි හරියටම සටන් කරන්න පටන් ගත්තේ කියලා. මෙම ප්‍රශ්නය ප්‍රේක්ෂකයා තුළ ඇති කරවමින් මම නාට්‍ය අවසන් කරනවා. එය ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කිරීමකි.





පෙරහුරුව අතරතුර සෙම්මුගම් ප්‍රසංග කණ්ඩායම

නමුත් ඔහු විසින් රචනා කරන ලද සියලුම නාට්‍ය යථාර්ථයක්, සත්‍යයක්, පාඩමක් ගෙන ඒම සඳහා රූපක සහ සංකේතවාදයට භාවිතා කරන්නේ නැත. "අපි මෑතකදී මනච්චිරායි නොහොත් සිරගත වූ හදවත් නමින් නාට්‍යයක් කළා," සත්‍යසීලන් පවසයි. "ඒක එල්.ටී.ටී.ඊ කාන්තා සටන්කාමියෙක් ගැන කතාවක්. ඇය අද තනියම වවුනියාවේ ජීවත් වෙනවා. යුද්දෙ කාලෙ ගොඩක් අය ඇයට ගෞරවාන්විතව සැලකුවා. ඇයට තවදුරටත් එම පිළිගැනීම ලැබෙන්නේ නැත. ඇය තවදුරටත් සන්නද්ධ නොවන අතර කිසිවෙකු ඇය කෙරෙහි අවධානය යොමු නොකරයි. අපි ඇය ගැන ඍජුව කතා කළා."

සෙම්මුගම් නාට්‍ය කණ්ඩායමේ සාමාජිකාවක් වන ශාන්තිනී අරුඤ්ඤවරාසා වවුනියාවේ අයෙකි.නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංග කලාව හදාරන ඇය දිවයිනේ විවිධ ප්‍රදේශවල ජනතාව දැන හඳුනා ගැනීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකයි: "මම සාමය සහ සංහිඳියාව පිළිබඳ වැඩමුළුවලට සහ අපේ සිංහල සහෝදර සහෝදරියන් සමඟ නාට්‍ය ප්‍රසංගවලට සහභාගී වී තිබෙනවා. මම එය අසීමිත ලෙස භුක්ති වින්දා. " කෙසේ වෙතත් ඇයගේ ඉලක්කය වන්නේ ගුරුවරියක් වීමයි. "මම ගුරුවරියක් වුනාට පස්සේ, මගේ අත්දැකීම් සහ ඉගෙනීම් මගේ සිසුන් එක්ක බෙදාගන්නවා; අපි මේ පණිවිඩ ඒ පරම්පරාව වෙත ගෙන යන්න ඕනේ. අපි වෙනත් සංස්කෘතීන් පිළිගැනීම, විවිධ දෘෂ්ටි කෝණයන්ට ගරු කිරීම වර්ධනය කරන්න ඕන. ඔබ කුඩා දරුවෙකු කාලයේ, ඔබට අනෙකුත් භාෂා නොතේරුණත් ඔබ ස්වභාවිකවම වෙනත් භාෂාවක් කතා කරන අයෙකුගේ අත අල්ලා ගනු ඇත. අපි වයසින් වැඩෙනකොටත් ඒ සමීපභාවය පෝෂණය කළ යුතුයි."

සත්‍යසීලන් විශ්වාස කරන්නේ සෙම්මුගම් නාට්‍ය කණ්ඩායම යනු සමාජ ව්‍යාපාරයක් මිස රාජ්‍ය නොවන සංවිධානයක් නොවන බවයි. "සාමය, සහජීවනය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, සමානාත්මතාවය, සමාජ සාධාරණත්වය යන අරමුණු සඳහා අපි දිගටම කටයුතු කරනවා. මම ලියපු



ගුරුවරියක ලෙස තමාට සුවිශේෂී භූමිකාවක් ඇති බව ශාන්තිනී අරුඤ්ඤවරාසා දකින්නීය

අලුත්ම පිටපත, පිපාසය කියලා, පාරිසරික ප්‍රශ්නයක් ගැන. එය පදනම් වී ඇත්තේ ජල හිඟය, නාස්තිය, අසමානතාවය සහ එම ගැටළුවෙන් මිනිසුන් දුක් විඳින ආකාරය පිලිබඳව යි.”

ප්‍රසංග සඳහා ප්‍රේක්ෂක සහභාගීත්වය සාමාන්‍යයෙන් උද්යෝගිමත් වුවද, මිනිසුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර සැමවිටම ධනාත්මක නොවේ. “සමහර වෙලාවට නාට්‍යයක් රඟපානකොට අපිට පොඩි චකිතයක් දැනිලා තියෙනවා,” සත්‍යසීලන් සඳහන් කරනවා, “සමහරු ඒක ආචාරශීලීව පිළිගෙන ඉදිරියට යනවා. නමුත් ප්‍රේක්ෂකාගාරයේ සිටින ඇතැම් පුද්ගලයන්ට ඔවුන් ඇසීමට කැමති ප්‍රශ්න ඇති නමුත් ඔවුන් ඒ ප්‍රශ්න නොඅසා පසුබසිනවා යැයි අපට හැඟෙනවා. ඒ වගේම, ගැටුම් ඇති කරන අයත් ප්‍රේක්ෂකයන් අතර ඉන්නවා. ඔබට අවශ්‍ය අපි සාමයෙන් ජීවත් වීමයි. නමුත් ඔවුන් තවමත් අපේ ඉඩම අපට දුන්නේ නැහැ. ඉතින් අපි කොහොමද සාමයෙන් ඉන්නේ, මෙවැනි ප්‍රතිවිරෝධතා පෙන්වන අවස්ථා නාට්‍ය තුළ දැකිය හැකිය.

නමුත් සත්‍යසීලන් වඩාත් ධනාත්මක ය. “සාමය සාක්ෂාත් කර ගැනීම ගැන මම යම් විශ්වාසයක් ගොඩනඟාගෙන තියෙනවා. මම හිතන්නේ උතුරේ සහ නැගෙනහිර ජනතාව ඇත්තටම දකුණේ ජනතාව තේරුම් ගෙන නැහැ සහ අනෙක් පැත්තත් එහෙම්මමයි. ඒත් මට තේරෙන්න පටන් අරන් තියෙන්නේ  අපේ මතවලට හැමවිටම දේශපාලනය සහ බලය බලපෑවා. දැන් ඒක වෙනස් වෙමින් පවතිනවා.”

# එදිනෙදා ප්‍රජාතන්ත්‍රවාදය අවබෝධ කර ගැනීම

“සාමාන්‍යයෙන් ගොඩක් දෙනෙක් සිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රධාන වශයෙන් දේශපාලන ක්ෂේත්‍රය තුළ තිබෙන දෙයක් බවයි. එහෙම හිතන එක ගොඩක් වැරදියි. ප්‍රජාතන්ත්‍රවාදය යනු අපගේ නිවෙස්වලට සහ ප්‍රජාවට, අපගේ පාසල්වලට, අපගේ සේවා වටපිටාවට අදාළ වන සංකල්පයක්” යනුවෙන් වවුනියාවේ ආයුර්වේද වෛද්‍ය සහ උපදේශිකාවක වන 30 හැවිරිදි වෛද්‍ය අභිරාමි සිවඥානම් පවසයි.‘‘මමත් මෑතකදී තමයි මේ සම්බන්ධ දැනුම ලබා ගත්තේ. මම වෙනසක් කිරීමට කැමති කෙනෙක්, ඒ නිසා මම SCORE විසින් පවත්වන ලද පුහුණුකරුවන්ගේ පුහුණුවට සහභාගී වුණා. ඒක නිසයි මට මේ දැනුම ලබා ගන්න හැකි වුණේ.”

මුලතිව්, මොණරාගල, වවුනියාව, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල සමාජ ඒකාබද්ධතා සහ සංහිඳියාව (SCORE) වැඩසටහනේ හවුල්කාර සංවිධානවල සාමාජිකයින් විසි දෙදෙනෙකු සඳහා ‘දිනපතා ප්‍රජාතන්ත්‍රවාදය හරහා ඔරොත්තු දෙන ප්‍රජාවන්’ පුහුණු මොඩියුලය පිළිබඳ තෙදින වැඩමුළුවක් 2020 අගෝස්තු මාසයේදී පැවැත්විණි. අන්තර්ක්‍රියාකාරී මෙවලම් සහ ශිල්පීය ක්‍රම භාවිතා කරන ලද එම පුහුණුව වැඩිහිටියන් සඳහා වූ ඉගෙනුම් මූලධර්ම මත පදනම් විය. ජීවිත අත්දැකීම් ඇදා ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදයේ විවිධ පැතිකඩ ඵලදායීව සංවාදයට ලක් කරමින් සැබෑ ජීවිතයේ අත්විඳින තත්වයන් සඳහා නව දැනුම භාවිතයේ යෙදීම කෙරෙහි මෙම පුහුණුවේදී අවධානය යොමු කිරීම සිදු කෙරිණි.



දින තුනක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව සඳහා දිස්ත්‍රික්ක පහක සාමාජිකයන් සහභාගී විය ‘දිනපතා ප්‍රජාතන්ත්‍රවාදය හරහා ඔරොත්තු දෙන ප්‍රජාවන්’



“මෙම වැඩමුළුවට ඉංග්‍රීසි, දෙමළ සහ සිංහල යන භාෂාවලින් ලියා ඇති අපූරු පුහුණු අත්පොතක් භාවිතා කළා, ඒ ඉගෙනීමේ අත්දැකීම අමතක වෙන්නේ නැහැ. මම හිතන්නේ ඒක කියන්නම ඕනෙමයි” ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ ස්වේච්ඡා සම්බන්ධීකාරකවරයෙකු සහ රක්ෂණ සමාගමක ශාඛා කළමනාකරුවෙකු වන (24) හැවිරිදි බාල්රාජ් තර්ෂන් පවසයි. “ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම නිරන්තරයෙන් උල්ලංඝණය වන ආකාරය සහ එහි ප්‍රතිඵලයක් හැටියට අපේ රටේ අසමානතාවය මෙතරම් බහුලව පවතින විධිය ගැන අපි කතා කළා. ප්‍රජාතන්ත්‍රවාදය බොහෝ මිනිසුන්ට නොතේරෙන දෙයක් හැටියට දිගටම තියෙන්න ඕනේ නැහැ. මම ඉගෙනගත්ත දේවල් අන් අය එක්ක බෙදා ගන්න මම හිටියේ නොඉවසිල්ලෙන්.

මිනිසුන් ප්‍රජාතන්ත්‍රවාදය තේරුම් ගන්නා තරමට වඩාත් සමානාත්මතාවය රැකෙන සමාජයක් නිර්මාණ කිරීමට හැකි වේ යැයි බාල්රාජ් තර්ෂන් පවසයි



“වර්තමාන මාතෘකා පිළිබඳව ගැඹුරු සාකච්ඡාවන්හි නිරතවීමේ වැදගත්කම අපි අවබෝධ කර ගත්තා. අපිව බෙදා වෙන් කරන සහ අසමාන කරන සාධක ගැන බුද්ධි කලම්බනයක නියැලුනා,” වෛද්‍ය සිවඥානම් සඳහන් කරයි. “වැඩමුළුව කැඩපතක් වුනා. අපේ ගෙවල්වල ප්‍රජාතන්ත්‍රවාදය සහ සමානාත්මතාව අඩුයි කියලා මට තේරුණා. මම ඒක පැහැදිලිව දැක්කා අපි ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව භූමිකාවන් පරීක්ෂා කරද්දී, මට සාධාරණයක් වෙන්න ඕන. මගේ දරුවන්ට ඔවුන් කැමති ඕනෑම කෙනෙක් වෙන්න පුළුවන්. මම ඔවුන්ගේ තේරීම සීමා කරන්නේ නැහැ. ඔවුන්ට නර්තන ශිල්පීන් හෝ සංගීතඥයන් වීමට අවැසි නම්, එයද හොඳයි. හැම ක්ෂේත්‍රයක්ම වටිනවා.”

වෛද්‍ය අභිරාමි සිවඥානම්ට
අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ගෙදරින්
ආරම්භ වන බව තහවුරු කිරීමටයි

එකිනෙකාගේ තේරීම් සහ අයිතිවාසිකම්වලට ගරු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක ගුණාංගයකි. එදිනෙදා ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙන් අදහස් වන්නේ දෛනික ජීවිතය හැඩගස්වන අවිධිමත් සහ විධිමත් කණ්ඩායම් සහ ආයතන සඳහා ජනතා සහභාගීත්වය වැඩි කිරීමයි. එය පොදු යහපතට දායක වන ආකාරයෙන් පුද්ගල තේරීම් කිරීමට මිනිසුන්ට ඇති හැකියාවයි. එමෙන්ම අද සමාජය මුහුණ දෙන ලියලා වැඩෙන ගැටළු සමඟ කටයුතු කිරීමට මිනිසුන්ට ඇති හැකියාව ද ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්විය හැකිය.

මෙම වැඩමුළුව තුළින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අවබෝධ කර ගැනීමට පමණක් නොව එම විෂය පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සඳහා පහසුකම් සැලසිය යුතු ආකාරය පිළිබඳව ද උගත හැකි විය. “අපි පහසුකම් සපයන්නන් වෙනකොට අපට යම් අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. දැනුම තිබුනට එය බෙදා ගැනීම සැමවිටම පහසු නැහැ”, යයි පැවසුවේ අම්පාරේ එස්.එම්. ඉෆම්. “භාවිතා කරපු ඉගැන්වීමේ ක්‍රම ඉතා හොඳයි, හැමෝම උනන්දුවෙන් පුහුණුවෙහි නිරත වුණා. සහභාගිවන්නන්ගේ අවධානය රඳවාගනිමින් පරිකල්පනය අල්ලා ගන්නේ කෙසේදැයි අපි ඉගෙන ගත්තා. අපට එය ජීවිත කාලයටම ලැබුණු අවස්ථාවක්. වසංගතය ආශ්‍රිතව ප්‍රදේශයන්හි අගුලු දැමීමක් වූ විට ප්‍රධාන පහසුකම් සපයන්නන්ට දිස්ත්‍රික්ක පුරා ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් තුළ බිම් මට්ටමේ පුහුණුවක් පැවැත්වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා සහභාගී වන්නන්ට ලබා ගැනීමට මෙම වැඩමුළුවේදී හැකි වුනා.

2021 අප්‍රේල් මාසයේදී, යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16ක් නියෝජනය වන පරිදි, යාපනයේ කාන්තා සම්මේලනයේ සාමාජිකයින් 40 දෙනෙකු සඳහා දිනපතා ප්‍රජාතන්ත්‍රවාදය හරහා ඔරොත්තු දෙන ප්‍රජාවන් පිළිබඳ වැඩමුළුවක් SCORE විසින් පවත්වන ලදී. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන සාරධර්ම පිළිබඳ සහභාගී වන්නන්ට ඇති අවබෝධය වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වූ අතර, ඔවුන්ට ප්‍රජාව සමඟ මෙම සාරධර්ම සාකච්ඡා කිරීමට හැකි වන පරිදි සවන් දීම, ඇසීම, එකඟ නොවීමේ අවස්ථාවන්හිදී ඵලදායී ලෙස සම්බන්ධ වීම සහ ක්‍රියාදාමය සඳහා ප්‍රමුඛතා සැකසීම සිදුකෙරුණි.

මෙම පුහුණුවට විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියන් රැසක් සහභාගී වීම විශේෂත්වයකි. මීට වසර කිහිපයකට පෙර, 2018 දී, කාන්තා කණ්ඩායම්වල වසර ගණනාවක ක්‍රියාකාරීත්වයෙන් පසුව, ශ්‍රී ලංකා රජය විසින් කාන්තාවන් සඳහා අනිවාර්ය 25% ක කෝටාවක් ක්‍රියාත්මක කරමින් පළාත් පාලන මැතිවරණය පැවැත්වීම තුලින් ප්‍රාදේශීය සභාවල කාන්තාවන් සංඛ්‍යාව 100 සිට 2000 පමණ දක්වා වැඩි කිරීමට හැකිවිය. මෙය රටේ දේශපාලනය තුළ සම මට්ටමේ අවස්ථා නොමැති බව පෙන්වන පිරිමින්ගේ ආධිපත්‍යය පැතිරුණු තැනක් බවට පැහැදිලිව පිළිගැනීමක් විය. කෙසේ වෙතත්, කෝටාව යනු දේශපාලනයේ කාන්තාවන්ට සිදුවන අවාසිය සලකා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන්හි ඔවුන් කොන් කිරීම යන යතාර්ථය කල්තියා හඳුනාගෙන එම ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා තාවකාලිකව ගනු ලැබූ පියවරක් වේ. එසේම මේ තත්වය මෙරට වත්මන් සහ අනාගත පිරිමි මන්ත්‍රීවරුන් අතර ප්‍රතිවිරෝධතා ඇති කිරීමටද හේතු වී ඇත.



දේශපාලනයේ කාන්තා නියෝජනය ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් අංගයක් වන්නේ කෙසේදැයි කාන්තාවන් සාකච්ඡා කළහ



මරියා රොසරි දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියකි. "කාන්තාවන් දේශපාලනයේ සිටින එක වැදගත් බව මම විශ්වාස කරනවා. පළාත් පාලන ආයතනවල කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් තිබෙනවා, නමුත් මේ රටේ ජනගහණයෙන් 50% කට වඩා කාන්තාවන් ඉන්නවා," ඇය පවසන්නීය. "අපි පුහුණුව තුළින් ඉගෙන ගත් දේ අපේ සමාජයට අත්‍යවශ්‍ය යැයි මම විශ්වාස කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද සහ ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් අපට සහජීවනයෙන් සිටින්නට හැකිවන්නේ කෙසේද යන්න බොහෝ දෙනෙකුට වැටහෙන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම මත පදනම්ව අපේ කණ්ඩායමට අපේ ප්‍රජාව එක්ක අන්තර් ක්‍රියා කළ හැකි ආකාරය අපට ඉගෙනගන්න ලැබුනා. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති උල්ලංඝණය වන ආකාරය දකිනකොට ප්‍රජාවේ සාමාජිකයන් හැටියට අප හඬ නැගිය යුතු විදියද අපි සාකච්ඡා කළා. එය කාන්තා දේශපාලන නියෝජිතයින්ට ද ඉතා වටිනා නිර්මාණාත්මක වැඩමුළුවක් වුනා. මට අවශ්‍ය දේශපාලනයෙන් ඉදිරියට යන්න, පළාත් මට්ටමට ගිහින් ජාතික මට්ටමට යන්න. මෙය ඒ සඳහා හොඳ පදනමක්, හොඳ සූදානමක් වුනා.

> දේශපාලනයේ ඉදිරියට යාමට කැමති කාන්තාවන්ට ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පිළිබඳ මනා අවබෝධයක් අත්‍යවශ්‍ය බව සිවරාසා මාරියා රෝසරි මහත්මිය පවසන්නීය

"මම දේශපාලනය ගැන එතරම් උනන්දුවක් දක්වන්නේ නැහැ, එත් මේ සමාජයේ ජීවත් වන මිනිසුන් හැටියට අපට වගකීමක් තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් ශක්තිමත් කිරීමට සහ අසමානතාවයට පිළියම් යෙදීමට. එසේම ගතානුගතික චින්තනයට එරෙහිව සටන් කිරීම වැනි ක්‍රියාවලියන්හිදී අපට බොහෝ ගැටලුවලට මුහුණ දෙන්නට සිදුවනු ඇති බව දන්නවා. නමුත් අපි ඒ අභියෝගය භාර ගතයුතුයි."



මෑතකදී ප්‍රාදේශීය සභාවට තේරී පත් වූ සුජීව ජයරාමශර්මාට දේශපාලන සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව පැවතියේ මෙවැනි අදහසකි "මම සැමවිටම ප්‍රජාතන්ත්‍රවාදය දැන සිටියේ ජනතාවගේ කැමැත්ත මත පදනම් වූ පාලන ක්‍රියාවලියක් ලෙසයි," ඇය පවසන්නීය. "ප්‍රජාතන්ත්‍රවාදයට ඉන් එහා ගිය වඩා පුළුල්, ගැඹුරු අර්ථයක් තිබෙන බව මා දන්නේ දැන්. තව බොහෝ දේ සාක්ෂාත් කර ගැනීමට තිබෙන බවත්, එය කළ හැක්කේ අප සමගියෙන් සිටියහොත් පමණක් බවත් මම දන්නවා. මේ වන විට කාන්තා දේශපාලඥවරියන් ගැන ජනතාවට විශ්වාසයක් නැහැ. ඒත් අපි අපි ගැන විශ්වාසයක් ගොඩනගා ගනිමින් ඉන්න නිසා මේ තත්ත්වය වෙනස් වෙන බව දන්නවා."

දේශපාලන පක්ෂ ක්‍රමය සහ දේශපාලඥයන් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ළඟා කර ගැනීමට ඇති ලොකුම බාධාව බව දේශපාලනයේ නියැලෙන ජයරාමශර්මා මහත්මිය පිළිගන්නීය. අපි ගමට වැදගත් දෙයක් කරන්න උත්සාහ කරනවා, ඔවුන් එන්නේ ගෞරවය ලබාගන්න විතරයි. ඔවුන් සමාජ බෙදීම් ඇති කරනවා, ඔවුන්ගේ හැසිරීම්, ඔවුන් තම බලපෑම් කරන ආකාරය සහ ඔවුන්ගේ බලය භාවිතා කරන ආකාරය සමාජය අවුල් ජාලයකට ගෙන යනවා. එය වෙනස් විය යුතුයි."

> සුජීව ජයරාමශර්මා විශ්වාස කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට ඇති බාධා ආමන්ත්‍රණය කිරීමට කාන්තාවන් කටයුතු කළ යුතු බවයි

තවද පවතින සමාජ ආකල්ප සහ වෙනස් කොට සැලකීම් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට බාධා කරන ආකාරය ගැන වැඩමුළුවට සහභාගිවන්නන් කතා කළහ. කෙසේ වෙතත්, ඔවුන් එම අභියෝගවලට මුහුණ දීමට ඔවුන්ට ඇති සැලසුම් පිළිබඳව ප්‍රකාශ කර සිටියහ "ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ස්ථාපිත කිරීමට කාන්තාවන් දේශපාලනයට ඇතුළත් කිරීම වැදගත්" යැයි චන්ද්‍රවදනී කඳුරරාසා පවසයි. "ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් කුඩා ප්‍රජා සංවිධාන ඇතුළු සමාජයේ විවිධ මට්ටම්වල ක්‍රියාත්මක කළ යුතුයි. මම මවක්, අපගේ සමාජය සැබවින්ම ප්‍රජාතන්ත්‍රවාදී කිරීමට කුඩා කල සිටම මෙම සාරධර්ම අපේ දරුවන් සමඟ බෙදා ගැනීම කෙතරම් වැදගත් දැයි මට වැටහෙනවා."

# රාජකාරියේදී
# සේවයේ සමානාත්මතාවය රඳවාගැනීම

සේවා සැපයීමේදී වෙනස් කොට සැලකීම පිළිබඳ චෝදනා එල්ලවූ රාජ්‍ය නිලධාරියෙකුට ඔබ මුහුණ දෙන්නට සිදු වී නම්, ප්‍රතික්‍රියාව ද ගැටුම්කාරී සහ ඵලදායි නොවන එකක් වීමට ඉඩ ඇත. නමුත් වෙනස් කොට සැලකීමකින් තොරව පාරිභෝගික සේවා සපයන රජයේ නිලධාරීන් සමූහයක් සමඟ ඔබ යම් කාලයක් ගත කරන්නේ නම්, ප්‍රතිඵලය හාත්පසින්ම වෙනස් එකක් විය හැකිය.


සමාජ ඒකාබද්ධතා සහ සංහිඳියාව (SCORE) වැඩසටහන දිස්ත්‍රික්ක අටක රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් සිදු කරනු ලැබූ 'වෙනස් කොට සැලකීමකින් තොරව පාරිභෝගික සේවා සැපයීම' පිළිබඳ වැඩමුළු දාහතක් හරහා සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරනු ලැබුවේ මෙයයි. ජාතික සාම මණ්ඩලයේ (SCORE) ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද පුහුණු මොඩියුලය, සේවා සැපයීමේදී වෙනස් කොට සැලකීම් පිළිබඳව කරන ලද පර්යේෂණයකින් හෙළිවූ කරුණු වලට අනුව සේවා ලාභින්ගේ දෘෂ්ටි කෝණයෙන් පෙනෙන ආකාරය මත පදනම් කරගෙන නිර්මාණය කර ඇත. "සංහිඳියා වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා එදිනෙදා සාම දර්ශක" යන අධ්‍යයනය සාමය සඳහා වූ එක්සත් ජනපද ආයතනය විසින් සිදු කරන ලද අතර එය ක්‍රියාත්මක කරනු ලැබුවේ ශ්‍රී ලංකා සමාජ විද්‍යාඥයින්ගේ සංගමය විසිනි. එය තවත් බොහෝ SCORE ක්‍රියාකාරකම් සඳහා අරමුණු සැකසීමට මඟ පෙන්වන ලදි.

අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන සංවර්ධන නිලධාරිනියක් වන 46 හැවිරිදි චිත්‍රලතා පවසන්නේ, "අපි සාමාන්‍යයෙන් අපේ ගනුදෙනුකරුවන්ට හොඳින් සේවය සපයන බව හිතනවා, ඒත් අපි නිතරම ඒ ගැන හිතන්නේ නෑ. ඇය 2003 වසරේ කොළඹ විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා රජයේ සේවයට එක් වූ තිදරු මවකි. "අපට කිසි දවසක මෙම විෂය කෙරෙහි අවධානය යොමු කරන සහ අවශ්‍යතාවයක් දැනුණු වැඩසටහනක් තිබුණේ නැහැ. නමුත් දැන් මට පේනවා මේක සියලුම රාජ්‍ය සේවකයන්ට අදාළයි, ජනතාවට වඩා හොඳ සේවයක් සැපයීමට අපි නතරම කටයුතු කළ යුතුයි කියන එක."



චිත්‍රලතා මහත්මිය පවසන්නේ මෙම වැඩමුළුවට සහභාගිවන්නන් ස්වයං විවේචනයට ලක් කරගැනීමට පෙළඹුණු බවයි

වෙනස් කොට සැලකීමකින් තොරව සේවා සැපයීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කරන ලද වෙනස්කම් පිළිබඳ න්‍යාය වැඩමුළු හරහා අපේක්ෂා කළ පරිවර්තනය සිතියම් ගත කෙරිණි. එය සේවා සැපයීමේදී වෙනස් කොට සැලකීම සිදු නොකිරීම සඳහා අවශ්‍ය අඛණ්ඩව ඒකාග්‍ර වීමට ඇති අවශ්‍යතාවය පෙන්නුම් කරයි.




පුහුණු මොඩියුලයේ ප්‍රවේශය දින දෙකක් තුළ පියවර තුනක් සහිත එකකි. පළමු පියවර සහභාගීවන්නන්ට කතන්දර සහ පර්යේෂණ අධ්‍යයනයන්හි සොයාගැනීම් හරහා වෙනස් කොට සැලකීම පිළිබඳ විවිධ පැතිකඩ අවබෝධ කර ගැනීම සඳහා මග පෙන්වයි. එතුළින් වෙනස් කොට සැලකීම සිදුවිය හැකි විවිධ ක්‍රම පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. සේවා සැපයීමේදී වාර්ගික හා ආගමික වෙනස්කම් පිළිබඳ පැතිකඩ කෙරෙහි අවධානය යොමු කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ආබාධිතභාවය සම්බන්ධ වෙනස් කොට සැලකීමේ භාවිතයන් පරීක්ෂා කිරීමද සිදුවේ.

සහභාගිවන්නන්හට ශ්‍රී ලංකාව තුළ වෙනස් කොට සැලකීම දැකගත හැකි අංශ පහක් හඳුන්වා දෙනු ලැබේ. යුක්තිය, පොලිසිය, සෞඛ්‍යය, රාජ්‍ය පරිපාලනය සහ ප්‍රාදේශීය සභා යන එක් එක් අංශයට අදාළ සැබෑ ජීවිත අත්දැකීම් හඳුන්වා දෙන ලදි. ඉන්පසුව වෙනස් කොට සැලකීම ශ්‍රී ලංකාවේ සේවා සැපයීමට බලපාන ආකාරය පිළිබඳව සහභාගිවන්නන් සම්බන්ධ කරගනිමින් සංවාදයක් ගොඩනැගීම සිදුකරනු ලැබේ. මෙමඟින් සමාන වූ සේවා සැපයීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් වශයෙන් රාජ්‍ය භාෂා පනත සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්බන්ධව කෙටියෙන් සාකච්ඡා කෙරුණි.

දෙවන පියවර වූයේ මහජනතාවගේ අවශ්‍යතා සහ තත්වයන්ට සංවේදී වෙමින් ඔවුන්ට වෙනස්කොට නොසලකන ගුණාත්මක සේවාවක් සැපයීමේ භාවිතයන් පිළිබඳ අත්දැකීම් සහ ඉගෙනුම් බෙදාගැනීමයි. එතුළින් සහභාගීවන්නන්ට තම තමන් නැඹුරු වන විවිධ ආකාරයේ වෙනස්කොට සැලකීම් ස්වයං විවේචනයක් මඟින් පිළිගැනීමට පොළඹවන ලදි. ආයතනික ධූරාවලිය ආශ්‍රිත කරගෙන ඒ ඒ ආයතනයන්හි ආයතනික ක්‍රියාපටිපාටිවලට එක්කරගෙන ඇති ආයතනික පක්ෂග්‍රාහීභාවය මෙන්ම පුද්ගල මට්ටමෙන් සේවා ලාභීන් සමඟ කටයුතු කරනවිට ඇතිවන පුද්ගලික පක්ෂග්‍රාහීත්වය යන දෙආකාරයෙන්ම වෙනස්කොට සැලකීම් පිළිබඳ මෙහිදී සලකා බැලෙයි. සහභාගිවන්නන් හට පුද්ගල ආවර්ජනය සඳහා යම් කාලයක් ලබාදුන් අතර සේවා සපයන්නන් ලෙස ඔවුන් පක්ෂග්‍රාහී ලෙස ක්‍රියා කළා යැයි හැඟෙන සිදුවීමක් විස්තර කිරීමට අවකාශය සැලසීය. මෙම පියවර සහභාගිවන්නන්ට සේවා සපයන්නන් ලෙස තම භූමිකාවන් ආවර්ජනය කරමින් තමා අත්විඳින ලද සිදුවීම් සඳහා විකල්ප ප්‍රතිචාර සාකච්ඡා කිරීමටත් එකිනෙකාට උපකාර කිරීමටත් ඉඩක් විවර කරන ලදී.

දැනුම ලබාදීමටත් අපේ චින්තන රටාවන්ට බලපෑම් කිරීමටත් යොදාගත් විවිධ ක්‍රියාකාරකම්වලට මම කැමතියි. මේක ඉතා ආකර්ශනීය උත්සාහයක් ලෙස මම සලකනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන නිලධාරියකු වන ඒ.ඒ.සනොෆර් පවසයි. "සිද්ධි අධ්‍යයනයන්හි මම ලොකු වටිනාකමක් දැක්කා, ඒවා සාපේක්ෂ වුවත් පුළුල් චිත්‍රය තේරුම් ගැනීමට මට උපකාරී වුණා. දින දෙකක් වගේ කෙටි කාලයක් තුළ මේ වැඩමුළුවෙන් අපේ ආකල්ප වෙනස් කළා" එම්.එස්. පාතිමා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තවත් කාර්ය මණ්ඩල සාමාජිකාවක් ප්‍රකාශ කර සිටියාය.

තුන්වන පියවරේදී, සහභාගිවන්නන් පෙර සැසි හරහා හඳුනාගත් වෙනස් කොට සැලකීමේ භාවිතයන් නිවැරදි කරගත හැකි ක්‍රම බුද්ධි කලම්බනය කිරීම හරහා සොයා ගැනීමට උත්සහ කරන ලදි. සංස්කෘතික සාධක (ස්ත්‍රී පුරුෂ භාවය/කුලය/පංතිය මත පදනම් වූ ගැටළු) සහ පරිපාලනමය දුර්වලතා (භාෂාව සහ සන්නිවේදන ගැටළු, සේවා වෙත ප්‍රවේශ වීමට සරල සහ පහසු මාර්ග නොමැතිකම, සේවා ස්ථානය තුළ ධුරාවලිය) මත පදනම්ව මෙම පිළියම් වර්ගීකරණය කළ හැකි ආකාරය ඔවුන් සාකච්ඡා කළහ. ගැටළු සහ පක්ෂග්‍රාහී සිදුවීම් හඳුනාගනු ලැබුණි. විසඳුම් කෙටි, මධ්‍ය සහ දිගු කාලීන පිළියම් ලෙස වර්ග කෙරුණි. සහභාගිවන්නන්ට සේවා සපයන්නන් ලෙස නිශ්චිත දර්ශනයක් නිර්වචනය කිරීමටත් ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුළ වෙනස් කොට සැලකීමකින් තොරව සාක්ෂාත් කර ගත හැකි ඉලක්ක සකස් කිරීමටත් දිරිගන්වනු ලැබුණි.

“මම වැඩ කරන ප්‍රදේශයේ ජන වර්ග තුනේම මිනිස්සු ජීවත් වෙනවා. සහජීවනය සහ සංහිඳියාව හැමෝගෙම යහපැවැත්මට වැදගත්” යැයි අම්පාර, නවිදන්වේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 39 හැවිරිදි දෙගුරාසා දයාලරාජ් පැවසීය, ”අප නොදැනුවත්වම බොහෝ වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන් සිදු කරන බව මට වැටහුනා. පුහුණුවේ වැදගත්ම දෙය නම් අප කරන දේ සහ එය වැරදි බව අපට අවබෝධ වීමයි. වෙනස්කොට සැලකීම කියන්නේ මොකක්ද කියා වටහා ගැනීමට මේක හොඳ අභ්‍යාසයක් වුනා.”

”මගේ වැදගත්ම ඉගෙනීම, මම හිතන්නේ, අප වෙත පැමිණෙන වැඩි වරප්‍රසාද ලත් සහ බලවත් පුද්ගලයන්ට, මුදල් හෝ බලපෑමක් නොමැති අයට වඩා හොඳින් නොසැලකිය යුතු බව” එස්.එම්. වහාබ්, 36, අම්පාර, එරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ළමා ආරක්ෂක නිලධාරී ප්‍රකාශ කර සිටියේ ය. “අපි කරන වැඩ ගැන අපි බැරෑරුම් ලෙස සිතන්නට පටන් ගත් පළමු අවස්ථාව මේක. අපි වැඩමුළුව ඉවර කළාට පස්සේ අපේ සමහර අය කණ්ඩායමක් විදිහට එකතු වෙලා මෙම ප්‍රශ්නය විසඳන්න තීරණය කළා.”



එස්.එම්. වහාබ්ට වෙනස් කොට සැලකීමකින් තොරව සේවා සපයමින් රාජ්‍ය ක්ෂේත්‍රයේ දිගටම වැඩ කිරීමට අවශ්‍යයි

“අප විසින් භාවිතා කරනු ලැබූ පුහුණු මොඩියුලය ඵලදායි එකක් වූ අතර එය බරපතල ගැටලුවක් විසඳීම සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් විය. මට නිලධාරීන් කිව්වා මුලින් ඔවුන් වෙනස් කොට සැලකීමක් තියෙනවා කියලා පිළිගන්න කැමති වුණේ නැහැ කියලා. නමුත් පුහුණුව තුලින් අපගේ අඩුපාඩු අපි කැමැත්තෙන්ම නිහතමානීව පිළිගන්නා ආකාරයට නිර්මාණය කොට තිබුනා. කිලිනොච්චි සහ මුලතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තවත් පුහුණු වැඩමුළු අවශ්‍ය වූ නිසා අපි තවත් වැඩමුළු පහක් පැවැත්වීමට තීරණය කළා” NPC හි ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරි ඥානවල්ලිච්චම් වොට්කින්සන් මහතා පවසා සිටියේ ය.

“පුහුණුව අවසානයේ මට දැනුනේ සතුටක්.” දෙගුරාසා දයාලරාජ් පැවසීය. මම මගේ දැනුම, මගේ අවබෝධය, එක් පුද්ගලයෙකු සමඟ බෙදාගෙන, පසුව ඔහු එය වෙනත් අයෙකු සමඟ බෙදා ගන්නේ නම්, එය දාමයක් වගේ කරන්න හැකි නම් වෙනස්කම් වලින් තොර සේවාවක් මහජනතාවට ලබා දීමට අපට හැකියි. අපි හැමෝටම එක හා සමානව සැලකීම පමණක් නොව, අපි සෑම කෙනෙකුටම හොඳින් සැලකිය යුතු බව මට වැටහෙනවා, එවිට ඔවුන් අපගේ සේවාවන් සඳහා අප වෙත ළඟා වන විට ඔවුන්ට ආතතියක් නොදැනෙනු ඇති.”

“සෑම මසකම ඔවුන්ට ලේකම් කාර්යාලයේ සාකච්ඡා කිරීමට දිනයක් තිබෙන බව චිත්‍රලතා මහත්මිය පවසයි. “අපි ලබාගත් දැනුම සහ අවබෝධය බෙදා හදා ගැනීමට එම කාලය යොදා ගනිමු. මම හිතන්නේ නිලධාරීන් මහජනතාවට වඩා හොඳින් සැලකිය යුතු බව දැනගත යුතුයි වගේම නිලධාරීන් ඔවුන්ට සේවය කිරීමට අදහස් කරන බව මහජනතාවට දැනෙන්න ඕනේ. ගම් මට්ටමේ නිලධාරීන්ටද මෙය ඉතා වැදගත්. මම හිතන්නේ ඔවුන් වෙනුවෙන්ම වැඩමුළුවක් පැවැත්විය යුතුයි.”

NPC හි SCORE ක්‍රියාකාරකම්වල සහකාර අධීක්ෂණ සහ ඇගයීම් සම්බන්ධීකාරක නුවනි විශාකා පවසන්නේ “අපට ඇති කිරීමට අවශ්‍ය වූ ආකල්පමය වෙනස අපගේ ඇස් ඉදිරිපිටම සිදු වන ආකාරය අපට දැකගත හැකි වුනා. “නමුත් මෙය අප විසින් දිගටම කරගෙන යා යුතු ක්‍රියාවලියක්, දේශපාලන මතවාදය සහ පක්ෂ භේදය මත පදනම්ව වෙනස් කොට සැලකීම් සිදුවන බව සහාගිවන්නන්ගෙන් ඇතැමෙක් පිළිගත්තා. ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය හෝ වෙනත් ඕනෑම සාධකයක් මත පදනම්ව රාජ්‍ය සේවයේ වෙනස්කම් කිරීම රට තුළ සමාජ සහජීවනයට සහ සංහිඳියාවට බාධාවක් වේ. අපි සටන් කළ යුත්තේ ඒ පිළිබඳවයි.”

ප්‍රකාශයට පත් කරන ලද්දේ

**ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය**



අංක 12/14, පුරාණ විහාර පාර, කොළඹ 06, ශ්‍රී ලංකාව

දුරකථන : +94 11 2818344, 2854127, 2809348

ෆැක්ස් : +94 11 2819064

විද්‍යුත් තැපෑල : npc@sltnet.lk

**www.peace-srilanka.org**



ISBN: 978-624-5900-08-4

printed & design by **designwaves.lk**